2022 මුදල් වර්ෂය සඳහා
ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුවේ

කාර්ය සාධන වාර්තාව

2022 ஆம் ஆண்டிற்கான
காணி உரித்து நிருணய திணைக்களத்தின்

செயல் இலக்கு அறிக்கை

PERFORMANCE REPORT

of the Land Title Settlement Department
for the Financial Year 2022

ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව
காணி உரித்து நிர்ணயத் திணைக்களம்
LAND TITLE SETTLEMENT DEPARTMENT

බිම් සවිය ගීතය

බිම් සවියයි බිම් සවියයි //
ඔබගේ ශක්තිය බලය සදාතන
සත දිරිගැන්වූ උදාර නාමය
බිම් සවියයි ඒ බිම් සවියයි

වාද භේද නැති උරුමය සුරකින
හවුල් අවුල් නැති පරම සවිය ඇති
නිවහල් පලසක ලක්මව සතපන
අභීත මෙහෙවර බිම් සවියයි

බිමට සවිය රන් සවියක් වන ලෙස
දිවි හංහාවේ එතෙර දකින්නට
දේශ ශක්ති ස්ව ශක්ති සදාලන
අභීත මෙහෙවර බිම් සවියයි

පද රචනය — චන්දන මධුරසිංහ
සංගීතය, ගායනය — සහකාර හිමිකම් විමර්ශන නිලධාරී/ අතිරේක රෙජිස්ට්‍රාර් උඩුනුවර ප්‍රාදේශීය කාර්යාලය

ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ කොමසාරිස් ජනරාල්වරයාගේ පණිවිඩය

වර්ෂ 1903 දී ස්ථාපිත කරන ලද ඉඩම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව මේ වන විට අවු. 120 ක කාලයක් සම්පූර්ණ කර ඇත. 1903 වසරේ සිට ක්‍රමිකව විකාශනය වූ මෙම දෙපාර්තමේන්තුව වර්තමානයේ ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව ලෙස හඳුන්වනු ලබයි. මෙම දෙපාර්තමේන්තුව යටතේ පනත් දෙකක් ක්‍රියාත්මක වේ. එනම් 1931 අංක 20 දරන ඉඩම් නිරවුල් කිරීමේ ආඥා පනත හා 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතයි. ඒ අනුව ඉඩම් නිරවුල් කිරීමේ ආඥා පනත මඟින් ඉඩම් නිරවුල් කිරීමේ කටයුතු ද, හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත මඟින් ඉඩම් හිමිකම් ලියාපදිංචි කිරීමේ කටයුතු ද සිදු කරනු ලබයි. එම ක්‍රියාවලීන් අවසානයේ ඉඩම් නිරවුල් කිරීමේ ආඥා පනත යටතේ රජයේ සහ පෞද්ගලික ඉඩම් අයිතිය තීරණය කිරීමත්, හිමිකම් ලියාපදිංචි කිරීමේ ආඥා පනත යටතේ හිමිකම් සහතික පත්‍රයක් ඉඩම් හිමියන් වෙත ලබාදීමත් සිදු කරනු ලබයි. මෙහිදී විශේෂයෙන් සඳහන් කළ යුත්තේ හිමිකම් ලියාපදිංචි කිරීමට අදාළ බිම් සවිය වැඩසටහන සාර්ථක කර ගැනීම සඳහා මිනින්දෝරු දෙපාර්තමේන්තුව හා රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව අනගි සහයක් ලබා දෙන බවයි. ඒ සඳහා මෙම අවස්ථාවේදී සර්වේයර් ජනරාල්, අතිරේක සර්වේයර් ජනරාල් (හි.ලි.ප.) ඇතුළු කාර්යය මණ්ඩලයටත් රෙජිස්ට්‍රාර් ජනරාල් වෙනුවෙන් වැඩසටහන සම්බන්ධීකරණය කළ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය රෙජිස්ට්‍රාර් ජනරාල්, සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල් (හි.ලි.ප.) හා කාර්යය මණ්ඩලයටත් ඉතා කෘතඥපූර්ව වෙමි.

තවද 2022 වර්ෂය අවසාන වන විට ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව ලබා ඇති ප්‍රගතිය ලෙස 1931 සිට 2022.12.31 දක්වා ඉඩම් නිරවුල් කිරීමේ ආඥා පනත යටතේ නිරවුල් කිරීමේ ආඥාව මඟින් ගම් 9491ක් සඳහා අවසාන වාර්තා නිකුත් කර ඇත. 1998 සිට 2022.12.31 දක්වා හිමිකම් ලියාපදිංචි කිරීමේ ආඥා පනත අනුව 14 වගන්තිය යටතේ ඉඩම් කැබලි 898,125ක් සඳහා තීරණ ලබා දී ඇත.

කෙසේ වුවද 1998 සිට මේ දක්වා දෙපාර්තමේන්තුව ලබා ගෙන ඇති සමස්ත ප්‍රගතිය පිළිබඳ සෑහීමකට පත් විය නොහැකි අතර මේ සඳහා විවිධ බාහිර මෙන්ම අභ්‍යන්තර සාධකද ඒ සඳහා හේතු වී ඇත. ඉඩම් නිරවුල් කිරීමට අදාළ ගැටළු ලෙස මැනුම් ආශ්‍රිත තාක්ෂණික ගැටළු මතු වීම, පැරණි ලිපිගොනු අස්ථානගතව පැවතීම, බොහෝ පැරණි සිතියම් ඇසුරින් නිරවුල් කිරීමට සිදු වීම හා එම සිතියමට අදාළව ඇති ක්ෂේත්‍රය වර්තමානයේ වෙනස් වී තිබීම, පැරණි උරුමකරුවන්ගේ විස්තර සමඟ වත්මන් උරුමකරුවන් හඳුනා ගැනීමේ දී බොහෝ දුෂ්කරතාවයන්ට ලක්වීමෙන් උරුම විභාග වලදී ප්‍රමාදයන් සිදු වීම වැනි දෑ දැක්විය හැක. හිමිකම් ලියාපදිංචි කිරීමේ ගැටළු ලෙස පනතේ දුර්වලතා අපේක්ෂිත කාර්ය මණ්ඩලයක් නොලැබීම, හිමිකම් නිරවුල් කිරීම වැනි සංකීර්ණ කාර්යය සඳහා පුහුණුව ලැබූ විමර්ශන කාර්ය මණ්ඩලය දෙපාර්තමේන්තුවෙන් ඉවත්වීම, පුද්ගලික ඉඩම් පිළිබඳ හිමිකම් තීරණය කිරීමේදී ක්ෂේත්‍ර විමර්ශනයේදී මතුව ඇති අනපේක්ෂිත තත්ත්වයන් හා ඉඩම් ආශ්‍රිත නඩු විශාල සංඛ්‍යාවක් පැවතීම වැනි ගැටළු වේ. පොදුවේ ගත් කළ සමස්ත දෙපාර්තමේන්තුවම මුහුණ දුන් ගැටළු ලෙස 2020 හා 2021 වර්ෂවලදී උද්ගත වූ කොවිඩ් 19 වසංගත තත්ත්වය තුළ රාජකාරි කටයුතු සීමා

වීම ද 2022 වර්ෂයේ රටේ ඇති වූ ආර්ථික අර්බුදය නිසා පැවති ඉන්ධන හිඟය ද දැක්විය හැකි අතර එම නිසා ප්‍රශස්ත ප්‍රගතියක් අත් කරගැනීමට තවදුරටත් බාධා මතු විය.

නමුත් 2023 වර්ෂයේ සිට එම බාධක මඟ හරවා ගනිමින් ඉදිරියේදී මුහුණ දීමට ඇති අභියෝගද ජයගනිමින් සාර්ථක ප්‍රගතියක් කරා ළඟා වීමට සැලසුම් සකස් කරමින් පවතී. ඒ යටතේ 2023 සිට බිම් සවිය වැඩසටහන ක්‍රියාත්මක කරන්නා වූ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස ගණන 66 සිට 100ක් දක්වා ව්‍යාප්ත කිරීම, නිළධාරීන් අභිප්‍රේරණය සඳහා පුහුණු වැඩමුළු ක්‍රියාත්මක කිරීම, කාර්යාල සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සැපයීම ආදී සැලසුම් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිතය.

අවසාන වශයෙන් ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව මඟින් මහජනතාව අපේක්ෂා කරන සේවාව උපරිම අයුරින් ලබා දීමට කැපවෙන සියළුම දෙපාර්තමේන්තු නිලධාරීන්ටත්, විශේෂයෙන් ප්‍රාදේශීය කාර්යාලවල සේවය කරන නියෝජ්‍ය/ සහකාර කොමසාරිස්වරුන්ටත් සහකාර හිමිකම් විමර්ශන නිලධාරීන්ටත්, ඒ සඳහා සහය ලබාදෙන අනෙකුත් ආයතන හා ඒවායේ කාර්යමණ්ඩල නිලධාරීන්ටත් මාගේ කෘතවේදිත්වය පළ කරමි.

ශ්‍රී ලංකාව, දීර්ඝ ඉතිහාසයක් සහිත එනිසාම ඉඩම් හිමිකම් නිරවුල් කිරීම පිළිබඳ සංකීර්ණ නීති සම්ප්‍රදායන්, භාවිතයන්ගෙන් මෙන්ම විචිත්‍ර ආකල්පයන්ගෙන් යුත් ජනතාවක් සහිත රටක් වන අතර එම ගැටළුකාරී සංකීර්ණ තත්ත්වයන් අවම කර ගනිමින් සෑම ඉඩමකටම නිරවුල් හිමිකමක් ලබා දීමට කටයුතු කිරීම ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුවේ ඒකායන අරමුණ වේ.

පී.සී.ඩී.සිගේරා
ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ කොමසාරිස් ජනරාල්

පටුන

පරිච්ඡේදය 01 ..... - 1 -

ආයතනික පැතිකඩ ..... - 1 -

1.1 හැඳින්වීම ..... - 1 -

1.2 ආයතනයේ දැක්ම,මෙහෙවර හා අරමුණු ..... - 2 -

1.3 කාර්යයන් ..... - 3 -

1.4 සංවිධාන සටහන ..... - 4 -

1.5 දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ ..... - 4 -

1.6 දෙපාර්තමේන්තුව යටතේ පවතින ආයතන/අරමුදල් ..... - 6 -

1.7 විදෙස් ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු ..... - 6 -

පරිච්ඡේදය 02 ..... - 7 -

ප්‍රගතිය හා ඉදිරි දැක්ම ..... - 7 -

පරිච්ඡේදය 03 ..... - 8 -

වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය ..... - 8 -

3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය ..... - 8 -

3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය 9

3.3 මූදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය ..... - 10 -

3.4 මූල්‍ය ප්‍රකාශ සටහන් 11

3.5 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය 21

3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය 21

3.7 මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු වල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන 21

3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය 22

3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව 22

පරිච්ඡේදය 04 23

කාර්ය සාධන දර්ශක 23

4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක 23

පරිච්ඡේදය 05 24

තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය 24

5.1 හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු 24

5.2 තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග 24

පරිච්ඡේදය 06 25

මානව සම්පත් පැතිකඩ 25

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය 25

6.2 ආයතනයේ කාර්ය සාධනය කෙරෙහි මානව සම්පත් හිඟයෙහි/අතිරික්තයෙහි බලපෑම 25

6.3 මානව සම්පත් සංවර්ධනය 26

පරිච්ඡේදය 07 29

අනුකූලතා වාර්තාව 29

ඇමුණුම්

01. ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව - නිරවුල් කිරීමේ නිලධාරින් / කොමසාරිස්වරුන්ගේ /කොමසාරිස් ජනරාල්වරුන්ගේ නාම ලේඛනය

02. ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුවේ සංවිධාන සටහන

03. විගණකාධිපතිවරයාගේ වාර්තාව

2022 මුදල් වර්ෂය සඳහා
ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ කොමසාරිස් ජනරාල්ගේ
කාර්ය සාධන වාර්තාව

පරිච්ඡේදය 01
ආයතනික පැතිකඩ

1.1 හැඳින්වීම

දෙපාර්තමේන්තු ඉතිහාසය

ඉඩම් නිරවුල් කිරීම යනු රජයේ ඉඩම් පුද්ගලික ඉඩම් මොනවාද යන්න තීන්දු කර පුද්ගලික ලෙස තීන්දු කළ ඉඩම් අදාළ උරුමකරුවන් වෙත පුද්ගලික අයිතියට පවරා දීමත් එම ඉඩම් සඳහා ඔවුනට පිඹුරුපතක් නිකුත් කිරීමත් රජය සතු ඉඩම් රජය වෙත පවරා දීමත්ය. මෙවැනි ක්‍රියාවලියක් මේ රටට අවශ්‍ය වූයේ යම්කිසි ඓතිහාසික පසුබිමක් පදනම් කරගෙනය. වසර දහස් ගණනක් තිස්සේ මේ රටේ ජනතාව ඉඩම් භුක්ති විඳීමත්, පරිහරණය කිරීමත් කළ ද ඔවුන්ට එම ඉඩම්වල අයිතිය පවරා දීමක් සිදු නොවීය. ඉඩම්වල හිමිකම සනාථ කළ හැකි ඔප්පු තිරප්පු වැනි ලිඛිත සාක්ෂි කිසිවක් ඔවුන්ට නොවීය. මෙවැනි තත්ත්වයක් යටතේ බ්‍රිතාන්‍ය පාලකයින් විසින් **1840** අංක **12** දරන අනවසර ඉඩම් ආඥා පනත ප්‍රකාශයට පත් කරන ලදී.

මූලික වශයෙන් එම ආඥා පනතින් ප්‍රකාශ කරන ලද්දේ යම්කිසි පුද්ගලයකුට තම ඉඩම තමාට අයත් බව සනාථ කිරීමට නොහැකි වන්නේ නම්, එම ඉඩම රාජ සන්තක වන බවයි. මිනිසුන්ගේ පරම්පරාගත භුක්තිය හා වගාව බ්‍රිතාන්‍ය පාලකයින් විසින් සැලකිල්ලට නොගන්නා ලදී. ඔවුන් අදහස් කළේ අයිතිය සනාථ කිරීම ඔප්පු, තිරප්පු, සන්නස් වැනි ලිඛිත සාක්ෂි මඟින් කළ යුතු බවයි. මෙම තත්ත්වය යටතේ **1840** අනවසර ඉඩම් ආඥා පනත නිසා මිනිසුන්ගේ ඉඩම් අක්කර දහස් ගණනින් ඔවුනට අහිමි විය. ලංකාවේ ජනතාවට සිදු වූ මෙම අසාධාරණය පිළිබඳව එවකට සිටි ලංකාවේ දේශීය නායකයින් සිය විරෝධතාවය හා කනස්සල්ල ප්‍රකාශ කරන ලදී. මේ අනුව මෙම ගැටලුවට විසඳුමක් වශයෙන් රජයේ ඉඩම් මොනවාද පුද්ගලික ඉඩම් මොනවාද යන්න තීන්දු කිරීමේ නිරවුල් කිරීමේ ක්‍රියාවලියක් ආරම්භ කිරීමට බ්‍රිතාන්‍ය පාලකයින්ට සිදු විය. ඒ අනුව **1897** අංක **01** දරන මුඩු බිම් ආඥා පනත පනවන ලදී. මුලින් දිසාපතිවරුන් හා විශේෂ නිලධාරීන් විසින් ක්‍රියාත්මක කරන ලද ඉඩම් නිරවුල් කිරීමේ ක්‍රියාවලිය **1903** දී ස්ථාපිත කරන ලද ඉඩම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව යටතට පත් කරන ලදී. මුඩුබිම් ආඥා පනත ක්‍රියාත්මක කිරීමේදී ඇතිවූ අඩුපාඩු හා ඉන් ජනතාවට සිදු වූ අසාධාරණකම් නැති කර ගැනීමේදී වඩාත් නිවැරදිවූත් නීත්‍යානුකූලවූත් නිරවුල් කිරීමේ ක්‍රියාවලියක් සිදු කිරීම සඳහා **1931** අංක **20** දරන ඉඩම් නිරවුල් කිරීමේ ආඥා පනත පනවන ලදී.

දෙපාර්තමේන්තුවට අදාළ වූ මෙම ඉඩම් නිරවුල් කිරීමේ කාර්යය එසේම පවතින අතරතුරදී 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත සම්මත වීම මත ඉඩම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව, හිමිකම් ලියාපදිංචි කිරීමේ කාර්යයටද අවතීර්ණ විය. රජයේ සහ පුද්ගලික ඉඩම් වල අයිතිය තහවුරු කිරීම තුළින් දියුණු ඉඩම් කළමනාකරණ ක්‍රමයක් ඇති කිරීමත් ඉඩම් හා සම්බන්ධ වංචා, දූෂණ අවම කිරීමත් මෙහි ප්‍රමුඛ අරමුණු වේ. එමෙන්ම එකී කාර්ය භාර්ය වර්තමානය වන විට දෙපාර්තමේන්තුවේ ප්‍රමුඛ කාර්යභාර්ය බවට පත්වී ඇත.

1903 සිට 2022 දක්වා දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ නාම ලේඛනය
(ඇමුණුම් අංක 01 හි දක්වා ඇත)

1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර හා අරමුණු

දැක්ම

සෑම ඉඩමකටම නිරවුල් හිමිකමක්

මෙහෙවර ප්‍රකාශය

ඉඩම් නිරවුල් කිරීමේ හා හිමිකම් ලියාපදිංචි කිරීමේ ක්‍රියාදාමය තුළින් රජයේ හා පෞද්ගලික ඉඩම් අයිතිය තීරණය කොට, සෑම බිම් කොටසකම හිමිකම තහවුරු කිරීම තුළින් ශ්‍රී ලංකාව තුළ දියුණු ඉඩම් කළමනාකරණ ක්‍රමයකට දායක වීම.

අරමුණු

1. ඉඩම් නිරවුල් කිරීමේ ආඥා පනත යටතේ රජයේ සහ පුද්ගලික ඉඩම් අයිතිය තීරණය කිරීම.
2. හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත යටතේ උරුම අයදුම්පත් කැඳවීම, විමර්ශන කටයුතු සිදුකිරීම සහ හිමිකම් තීරණය කිරීම ඇතුළු අනෙකුත් කටයුතු කිරීම.
3. ආයතනික හැකියාව ශක්තිමත් කිරීම මඟින් හිමිකම් විමර්ශන සහ තීරණය කිරීමේ කටයුතු හා ඉඩම් නිරවුල් කිරීමේ කටයුතු කාර්යක්ෂමව හා ඵලදායී ලෙස ඉටු කිරීම.
4. මනා ක්‍රියාකාරිත්වයකින් යුත් හිමිකම් විමර්ශන කාර්යාල ප්‍රාදේශීය මට්ටමින් පවත්වාගෙ යාම මඟින් හිමිකම් ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලියේ කාර්යක්ෂමතාව වර්ධනය කිරීම.
5. හිමිකම් විමර්ශන සහ තීරණය කිරීමේ කටයුතුවල සියලු අවස්ථාවන් සඳහා මහජන සහයෝගය ලබා ගැනීම සහ මහජන විශ්වාසය තහවුරු කරගැනීමට කටයුතු කිරීම.
6. ඉඩම් අයිතිය පිළිබඳ කාර්යක්ෂම සහ විශ්වාසනීය තොරතුරු පද්ධතියක් සංවර්ධනය කිරීම සහ පවත්වාගෙන යාම.
7. කාර්යක්ෂම පරිපාලන සහ ගිණුම් ක්‍රම පවත්වාගෙන යාම.

1.3 කාර්යයන්

දෙපාර්තමේන්තුව සතු මූලික කාර්යයන් පහත දැක්වේ.

- ❖ භිමිකම් විමර්ශන සහ තීරණය කිරීමේ කටයුතු, ඉඩම් නිරවුල් කිරීමේ කටයුතු සහ කාර්යාලීය පරිපාලනය කාර්යක්ෂමව සිදු කිරීම සඳහා ක්‍රමවේදයන් සහ පටිපාටි හඳුන්වාදීම සහ ක්‍රියාත්මක කිරීම.

- ❖ භිමිකම් විමර්ශන සහ තීරණය කිරීමට අදාළ කටයුතු වන,

  අ) ක්ෂේත්‍ර පරීක්ෂණ සිදු කිරීම

  ආ) උරුම අයදුම්පත් කැඳවීම

  ඇ) භිමිකම් විමර්ශන පැවැත්වීම

  ඈ) භිමිකම් තීරණය කිරීම

  ඉ) භිමිකම් තීරණය ගැසට් කිරීම යනාදිය ඉටු කිරීම.

- ❖ ඉඩම් නිරවුල් කිරීමට අදාළ කටයුතු වන,

  අ) නිරවුල් කිරීමේ උරුම විභාග පැවැත්වීම

  ආ) නිරවුල් කරන ලද ඉඩම් මැන වෙන් කිරීමට යැවීම

  ඇ) නිරවුල් කිරීමේ ආඥා ගැසට් පත්‍රයේ පළ කර ප්‍රසිද්ධ කිරීම

  ඈ) නිරවුල් කිරීමෙන් පසු ගම් නිදහස් කිරීම යනාදිය ඉටු කිරීම.

- ❖ භිමිකම් විමර්ශන සහ තීරණය කිරීමේ කටයුතු සහ ඉඩම් නිරවුල් කිරීමේ කටයුතු වලදී අදාළ අනෙකුත් ආයතන සමඟ සම්බන්ධීකරණය පවත්වා ගෙන යාම.

- ❖ කාර්ය මණ්ඩලයේ රාජකාරි කාර්යක්ෂමව සිදුකිරීමට අවශ්‍ය පුහුණුව සහ අනෙකුත් සම්පත් අවශ්‍යතා හඳුනාගෙන ඒවා සපයා දීම.

- ❖ භිමිකම් විමර්ශනය සහ තීරණය කිරීමේ කටයුතු සහ ඉඩම් නිරවුල් කිරීමේ කටයුතු සඳහා කාර්ය සාධන දර්ශක සැකසීම සහ කාර්ය සාධනය අධීක්ෂණය කිරීම.

- ❖ භිමිකම් විමර්ශන සහ තීරණය කිරීමේ කටයුතු සහ ඉඩම් නිරවුල් කිරීමේ කටයුතුවල ප්‍රගතිය මාසිකව අමාත්‍යාංශය වෙත වාර්තා කිරීම.

- ❖ ඉඩම් නිරවුල් කිරීමට අදාළ පැරණි සහ වටිනා ලේඛන සංරක්ෂණය කිරීම සඳහා කාර්යක්ෂම ලේඛන සංරක්ෂණ පද්ධතියක් පවත්වාගෙන යාම.

- ❖ භිමිකම් ලියාපදිංචි කිරීම පිළිබඳ මහජන අවබෝධය වර්ධනය කිරීම සහ සහයෝගය ලබා ගැනීම පිණිස දැනුවත් කිරීමේ රැස්වීම්, සාකච්ඡා සහ වැඩමුළු පැවැත්වීම.

- ❖ ප්‍රාදේශීය කාර්යාලවල කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම සහ ඔවුන්ට අවශ්‍ය සම්පත් ලබාදීම මඟින් මහජන අවශ්‍යතා සපුරා ගැනීමට අවකාශ සැලසීම.

- ❖ වාර්ෂික ඇස්තමේන්තු, විසර්ජන ගිණුම්, රජයේ නිලධාරීන්ගේ ඇස්තමේන්තු ගිණුම් සහ මාසික ගිණුම් සාරාංශ සැකසීම.

1.4 සංවිධාන සටහන

(ඇමුණුම් අංක 02 හි දක්වා ඇත)

1.5 දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ

- භිමිකම් නිරවුල් කිරීමේ අංශය
- ඉඩම් නිරවුල් කිරීමේ අංශය

දෙපාර්තමේන්තුව යටතේ පවතින ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස

දිස්ත්‍රික්කය	ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස
ගම්පහ	දිවුලපිටිය
	මීනුවන්ගොඩ
	මීරිගම I/II
	මහර
	අත්තනගල්ල
	දොම්පේ
	ගම්පහ
	ජා ඇල
	වත්තල
	කටාන
රත්නපුර	බලංගොඩ
	වැලිගෙපොල
	රත්නපුරය
	නිවිතිගල
	කුරුවිට
	ඉඹුල්පේ
	අයගම
කොළඹ	හෝමාගම
	මොරටුව
	කැස්බෑව
	රත්මලාන
	දෙහිවල
	කෝට්ටේ
මහනුවර	දොළුව/උඩපළාත
	යටිනුවර
	උඩුනුවර

දිස්ත්‍රික්කය	ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස
මහනුවර	හාරිස්පත්තුව
	ඔඔවටකෝරලේ
	ඔඔඉහළකෝරලේ
නුවරඑළිය	කොත්මලේ
අනුරාධපුරය	තඹුත්තේගම
	තලාව
	රාජාංගනය
	නැගෙනහිර නුවරගම් පළාත
හම්බන්තොට	ලුනුගම්වෙහෙර
	තිස්සමහාරාමය
	හම්බන්තොට
	බෙලිඅත්ත
කුරුණෑගල	රිදීගම
	මල්ලව පිටිය
	කුරුණෑගල
	පන්නල
	වාරියපොල
මොණරාගල	සියඹලාණ්ඩුව
බදුල්ල	රිදීමාලියද්ද
	මහියංගනය
පොළොන්නරුව	මැදිරිගිරිය
	හිඟුරක්ගොඩ
	තමන්කඩුව
	ලංකාපුර
මාතලේ	දඹුල්ල
	ගලේවෙල
පුත්තලම	වෙන්නප්පුව
	පුත්තලම
	නාත්තන්ඩිය
කළුතර	පානදුර
	හොරණ
	කළුතර
ගාල්ල	ගාල්ල
	හික්කඩුව
	ඇල්පිටිය
මාතර	වැලිගම
	මාතර
	හක්මන
කෑගල්ල	ගලිගමුව
යාපනය	නල්ලූර්

1.6 දෙපාර්තමේන්තුව යටතේ පවතින ආයතන / අරමුදල්

අදාළ නොවේ.

1.7 විදෙස් ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු

අදාළ නොවේ.

පරිච්ඡේදය 02
ප්‍රගතිය හා ඉදිරි දැක්ම

2022 වර්ෂයේදී 12 වගන්තිය යටතේ ගැසට් කිරීම සඳහා මිනින්දෝරු දෙපාර්තමේන්තුව විසින් සිතියම් 611ක ඉඩම් කැබලි 88,909ක් මැනුම් සිදු කර අප දෙපාර්තමේන්තුව වෙත ලබාදී ඇති අතර කැබලි 51,699ක් සම්බන්ධයෙන් 14 වගන්තිය යටතේ තීරණ නිර්දේශ ලබා දීමට දෙපාර්තමේන්තුව සමත්වී ඇත. මෙය 2021 වර්ෂයේදී පිළිවෙලින් සිතියම් 438 ක ඉඩම් කැබලි 60,969ක් හා 45,170ක් වේ. එමෙන්ම පනතේ 14 වගන්තිය යටතේ වන තීරණ අතුරින් මෙම වර්ෂයේදී ඉඩම් කැබලි 47,247ක් ගැසට් පත්‍රය මඟින් ප්‍රසිද්ධ කර ඇති අතර ඉඩම් කැබලි 32,452ක් හා සම්බන්ධ උපලේඛන හිමිකම් ලියාපදිංචිය සඳහා සහ හිමිකම් සහතික නිකුත් කිරීම සඳහා ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාල වෙත යොමු කොට ඇත. හිමිකම් ප්‍රකාශිත ගැසට් නිවේදනය පිළිබඳ විරෝධතාවක් ඇතොත් ඉදිරිපත් කිරීමට හැකි වන පරිදි මාසයක කාල පරාසයකින් පසු හිමිකම් සහතික සැකසීම සඳහා රෙජිස්ට්‍රාර් කාර්යාලවලට යොමු කරන අතර 2023 වර්ෂය සඳහා 14 වගන්තිය යටතේ තීරණ නිර්දේශ ලබා දීමට අපේක්ෂිත ඉලක්කය 212,392 බවද සඳහන් කරමි.

.....
ප්‍රධාන ගණන් දීමේ නිලධාරි
නම :
තනතුර :
දිනය : 2023/02/27

ඩබ්ලිව්.ඒ. චූලානන්ද පෙරේරා
ලේකම්
සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය
"මිහිකත මැදුර"
ඉඩම් මහලේකම් කාර්යාලය,
1200/6, රජමල්වත්ත පටුමග, බත්තරමුල්ල.

24/02/2023
.....
ගණන් දීමේ නිලධාරි
නම :
තනතුර :
දිනය :

පී.සී.ඩී. සිඟේරා
ඉඩම් හිමිකම් කිරුළු කිරීමේ කොමිසාරිස් ජනරාල් හා
කිරුළු කිරීමේ නිලධාරි
ඉඩම් හිමිකම් කිරුළු කිරීමේ දෙපාර්තමේන්තුව
1200/6, "මිහිකත මැදුර"
රජමල්වත්ත පාර, බත්තරමුල්ල.

පරිච්ඡේදය 03
වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය

3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

ඒසීඒ-එල්

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

රු.

අයවැය 2022		සටහන	2022	තත්‍ය 2021(නැවත ගලපන ලද)	
-	ආදායම් ලැබීම්		-	-	
-	ආදායම් බදු	1	-	-	ඒසීඒ-1
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	-	-	
-	ජාත්‍යන්තර වෙළඳාම මත බදු	3	-	-	
-	බදු නොවන ආදායම් හා වෙනත්	4	-	-	
-	මුළු ආදායම් ලැබීම් (අ)		-	-	
-	ආදායම් නොවන ලැබීම්		-	-	
-	භාණ්ඩාගාර අග්‍රිම		688,357,000	593,304,000	ඒසීඒ-3
-	තැන්පතු		9,355,919	7,862,678	ඒසීඒ-4
-	අත්තිකාරම් ගිණුම්		26,597,509	21,323,063	ඒසීඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්		29,869,014	25,808,033	
-	මුළු ආදායම් නොවන ලැබීම් (ආ)		754,179,442	648,297,774	
-	මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)		754,179,442	648,297,774	
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඇ)		-	-	
	ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඇ)		754,179,442	648,297,774	
	අඩුකළා : වියදම්				
-	පුනරාවර්තන වියදම්		-	-	
545,010,000	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	544,709,497	475,559,558	
20,006,000	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	19,510,445	15,047,392	ඒසීඒ-2(ii
8,080,000	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	7	8,021,247	7,593,373	
-	පොළී ගෙවීම්	8	-	-	
50,000	වෙනත් පුනරාවර්තන වියදම්	9	-	4,500	
-	මුළු පුනරාවර්තන වියදම් (ඊ)		572,241,189	498,204,823	
	මූලධන වියදම්				
2,500,000	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්	10	2,137,474	10,679,442	
-	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	11	-	14,980,104	
-	ප්‍රාග්ධන මාරුකිරීම්	12	-	-	ඒසීඒ-2(ii)
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම	13	-	-	
2,000,000	හැකියා වර්ධනය	14	911,388	900,000	
5,000,000	වෙනත් මූලධන වියදම්	15	3,504,348	-	
-	මුළු මූලධන වියදම් (උ)		6,553,210	26,559,546	
	තැන්පතු ගෙවීම්		5,887,919	5,442,258	ඒසීඒ-4
	අත්තිකාරම් ගෙවීම්		21,098,560	29,977,188	ඒසීඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්		-	-	
	ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)		26,986,479	35,419,446	
	මුළු වියදම් එ = (ඊ+උ+ඌ)		605,780,878	560,183,815	
-	දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය ඒ = (ඉ-එ)		148,398,564	88,113,959	
	අග්‍රම සැසඳුම් ප්‍රකාශය අනුව ශේෂය		148,398,564	88,113,959	ඒසීඒ-7
	දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය		-	-	ඒසීඒ-3
			-	-	

3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-පී

2022 දෙසැම්බර් 31 දිනට

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

	සටහන	2022 රු.	2021 රු.
		කත්‍ය	
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	ඒසීඒ-6	265,179,288	265,512,241
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒසීඒ-5/5(ඒ)	56,830,829	62,329,778
මුදල් හා මුදල් සමාන දෑ	ඒසීඒ-3	-	-
මුළු වත්කම්		322,010,117	327,842,019
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
ශුද්ධ වත්කම්		50,849,638	59,816,587
දේපළ පිරියත හා උපකරණ සංචිතය		265,179,288	265,512,241
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	ඒසීඒ-5(බී)		
ජංගම වගකීම්			
තැන්පතු ගිණුම්	ඒසීඒ-4	5,981,191	2,513,191
අග්‍රිම ශේෂය	ඒසීඒ-3	-	-
මුළු වගකීම්		322,010,117	327,842,019

පිටු අංක 7 සිට 27 දැක්වෙන ඉහත ඒසීඒ 1 සිට ඒසීඒ 7 දක්වා වූ ආකෘති පත්‍ර වලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ සටහන් පිටු අංක 28 සිට 33 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහි ම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශනයන් හි සටහන් මඟින් හෙළිදරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිතා කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

.....

ප්‍රධාන ගණන් දීමේ නිලධාරි
නම :
තනතුර :
දිනය : 2023/02/27

ඩබ්ලිව්.ඒ. වූලානන්ද පෙරේරා
ලේඛණ
සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය
"මිහිකත මැදුර"
ඉඩම් මහලේඛණ කාර්යාලය,
1200/6, රජමල්වත්ත පටුමඟ, බත්තරමුල්ල.

.....

ගණන් දීමේ නිලධාරි
නම :
තනතුර :
දිනය :

පී.සී.ඩී. සිල්වා
ඉඩම් කොමසාරිස් ජනරාල් හා
භාරවුල් කිරීමේ නිලධාරි
ඉඩම් කොමසාරිස් භාරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව
1200/6, "මිහිකත මැදුර"
රජමල්වත්ත පාර, බත්තරමුල්ල.

.....

ප්‍රධාන ගණකාධිකාරි
නම : එන්. ජී. හෙන්නයාක්
තනතුර : ප්‍රධාන ගණකාධිකාරි
දිනය : 2023-02-27

එන්. ජී. හෙන්නයාක්කාරි
ප්‍රධාන ගණකාධිකාරි
ඉඩම් කොමසාරිස් භාරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව
අංක. 1200/6, "මිහිකත මැදුර"
රජමල්වත්ත පාර.
බත්තරමුල්ල.

3.3 මූදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-සී

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මුදල් ප්‍රවාහ ප්‍රකාශය

	කත්‍ය	
	2022 රු.	**2021**(නැවත ඉලපන ලද) රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
මුළු බදු ලැබීම්	-	-
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර	-	-
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්	-	-
වෙනත් ශීර්ෂ වෙතුවෙන් එකතු කරන ලද ආදායම්	**29,869,014**	**25,808,033**
අග්‍රිම ලැබීම්	**688,357,000**	**593,304,000**
අත්තිකාරම් අයකර ගැනීම්	**30,822,982**	**27,291,941**
තැන්පතු ලැබීම්	**9,355,919**	**7,862,678**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	**758,404,915**	**654,266,652**
අඩුකළා : මුදල් වැය කිරීම්		
සුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	**562,181,180**	**500,309,071**
සහනාධාර සහ මාරුකිරීම්	**8,021,247**	**7,593,373**
වෙනත් වැය ශීර්ෂ වෙතුවෙන් දරන ලද වියදම්	**155,450,377**	**95,792,559**
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	-	-
අත්තිකාරම් ගෙවීම්	**20,842,982**	**30,149,287**
තැන්පතු ගෙවීම්	**5,887,919**	**5,442,258**
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	**752,383,705**	**639,286,548**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	**6,021,210**	**14,980,104**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
පොළී	-	-
ලාභාංශ	-	-
හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම	-	-
උපණය අයකර ගැනීම්	-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
ගැනීම්	**6,021,210**	**14,980,104**
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	**6,021,210**	**14,980,104**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඈ)-(ඉ)	**(6,021,210)**	**(14,980,104)**
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)	**(0)**	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්	-	-
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)	-	-
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ)	**(0)**	-
ජනවාරි **01** දිනට ආරම්භක මුදල් ශේෂය	-	-
දෙසැම්බර් **31** දිනට අවසාන මුදල් ශේෂය	-	-

3.4 මූල්‍ය ප්‍රකාශ සටහන්

සටහන - (i)

පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශය
(මු.රෙ. 106 හා මු.රෙ. 113 යටතේ වන පාඩු)

අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම : ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව
වියදම් ශීර්ෂ අංකය:287
වැඩසටහන් අංකය හා නාමය: 02 - සංවර්ධන වැඩසටහන

(i) වර්ෂය තුළ අලාභ අයකර ගැනීම/ කපාහැරීම/ අත්හැරීම් පිළිබඳ ප්‍රකාශය

අගය	සිද්ධි සංඛ්‍යාව	මුළු එකතුව (රු)
රු.25,000.00 අඩු	1	10,000
රු.25,000.01 වැඩි	1	43,000
එකතුව	2	53,000

අලාභයේ ස්වභාය අනුව සිද්ධි වර්ගීකරණය	සිද්ධි සංඛ්‍යාව	අගය (රු)
1. PC 2375 රත්නපුර ප්‍රා/කා අනතුර	1	10,000
2. PF 7866 බත්තරමුල්ල ඉන්ධන පිරවුම්හලේ අනතුර	1	43,000
එකතුව	2	53,000

(ii) අනුව කාල විශ්ලේෂණය

වසර 5 ට අඩු	සිද්ධි සංඛ්‍යාව	0
	ගණන	රු.
වසර 5-10	සිද්ධි සංඛ්‍යාව	0
	ගණන	රු.
වසර 10 ට වැඩි	සිද්ධි සංඛ්‍යාව	0
	ගණන	රු.

(ii) තවදුරටත් අයකර ගැනීමට හෝ කපා හැරීමට හෝ අත්හැරීමට ඇති පාඩු පිළිබඳ ප්‍රකාශය

අගය	සිද්ධි සංඛ්‍යාව	මුළු එකතුව (රු)
රු.25,000.00 අඩු	0	0
රු.25,000.01 වැඩි	0	0
එකතුව	0	0

අලාභයේ ස්වභාවය අනුව සිද්ධි වර්ගීකරණය	සිද්ධි සංඛ්‍යාව	අගය (රු)
1.	0	0
2.	0	0
එකතුව	0	0

සටහන - වැය විෂය 1701 යටතේ වර්ෂය තුළ ගිණුම්ගත කරන ලද හෝ ඉදිරි වර්ෂවලදී ගිණුම්ගත කිරීමට අපේක්ෂිත මු.රෙ. 106 යටතේ වන හානි හා මු.රෙ. 113 යටතේ වන අත්හැරීම් පිළිබඳ විස්තර ඇතුළත් කළ යුතු ය.

.....
ප්‍රධාන මූල්‍ය නිලධාරී/ප්‍රධාන ගණකාධිකාරී/
අධ්‍යක්ෂ (මුදල්)/කොමසාරිස් (මුදල්)
දිනය : 2023-02-23

එන්. පී. පොන්නාඩෝරා
ප්‍රධාන ගණකාධිකාරී
ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව
අංක. 1200/6, "මිහිකත මැදුර"
බත්තරමුල්ල.

පොත්වලින් කපාහැරීම පිළිබඳ ප්‍රකාශය

සටහන (ii)

අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම : ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව
වියදම් ශීර්ෂ අංකය:287
වැඩසටහන් අංකය හා නාමය: 02 - සංවර්ධන වැඩසටහන

1. වර්ෂය තුළ සිදු වූ මු.රෙ.109 යටතේ වන පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශය

අගය	සිද්ධි සංඛ්‍යාව	වටිනාකම (රු)
(i) රු.25,000.00 අඩු	0	0
(ii) රු.25,000.01 වැඩි	0	0
එකතුව	0	0

2. වර්ෂය තුළ මු.රෙ.109 යටතේ වන පොතෙන් කපා හැරීම් හා අයකර ගැනීම් පිළිබඳ ප්‍රකාශය

අලාභයේ ස්වභාවය	ආරම්භක කපා නොහල ශේෂය (රු.)	අලාභයේ වටිනාකම (රු.)	අයකර ගැනීම් (රු.)	පොතෙන් කපා හල අගය (රු.)	කපා නොහල ඉදිරියට ගෙන යන ශේෂය (රු.)	පොතෙන් කපා හැරීම සඳහා වූ අනුමැතියේ යොමු අංකය
1						
2						
3						
4						
5						
එකතුව						

සටහන - සටහන (i) හි අතුළත් ගිණුම්ගත කළ යුතු පාඩු හා අත්හැරීම් හැර මු.රෙ.109 යටතේ වන අනෙකුත් පාඩු හා අත්හැරීම් පමණක් මෙම ආකෘතියේ ඇතුළත් කළ යුතු ය.

.....
ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරි/
අධ්‍යක්ෂ (මුදල්)/කොමසාරිස් (මුදල්)
දිනය :

ඉඩම් හිමකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව
ප්‍රධාන ගණකාධිකාරි

බැදීම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශය (2022.12.31 ට)

ඇටහන (iii)

අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම : ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව
වියදම් ශීර්ෂ අංකය:287
වැඩසටහන් අංකය හා නාමය: වැඩසටහන 02

පුද්ගලයාගේ/ආයතනයේ නම	බැදීම් අංකය	දිනය	ශීර්ෂය	වැඩසටහන	ව්‍යාපෘතිය	උප ව්‍යාපෘතිය	වැය විෂයය	අයිතම අංකය	මූල්‍යකරණය	බැදීම් (රු.) (1)	බැදීම් ශේෂය (රු.) (2)=(1)-(3)	බැරකම් වලට ඇතුළත් දිනය	බැරකම් වටිනාකම (රු.) (3)	සංශෝධිත බැරකම් (රු.) (4)	බැරකම් නිදහස් කිරීම (රු.) (5)	බැරකම් ශේෂය (රු.) (6)=(4)-(5)
1. අමාත්‍යාංශ/රජයේ දෙපාර්තමේන්තු එකතුව																
2. රාජ්‍ය සංස්ථා/ව්‍යවස්ථාපිත මණ්ඩලය																
ශ්‍රී ලංකා ටෙලිකොම්		2022 දෙසැ	287	2	1	0	1402		11				1,314.88			1,314.88
ශ්‍රී ලංකා ටෙලිකොම්		2022 දෙසැ	287	2	1	0	1402		11				2,629.74			2,629.74
ශ්‍රී ලංකා ටෙලිකොම්		2022 දෙසැ	287	2	1	0	1402		11				1,314.88			1,314.88
ශ්‍රී ලංකා ටෙලිකොම්		2022 දෙසැ	287	2	1	0	1402		11				3,012.38			3,012.38
ශ්‍රී ලංකා ටෙලිකොම්		2022 දෙසැ	287	2	1	0	1402		11				13,097.15			13,097.15
ශ්‍රී ලංකා ටෙලිකොම්		2022 දෙසැ	287	2	1	0	1402		11				2,125.11			2,125.11
ශ්‍රී ලංකා ටෙලිකොම්		2022 දෙසැ	287	2	1	0	1402		11				1,294.38			1,294.38
ශ්‍රී ලංකා ටෙලිකොම්		2022 දෙසැ	287	2	1	0	1402		11				1,182.82			1,182.82
එකතුව													25,971.34			25,971.34
3. වෙනත්/පෞද්ගලික අංශය																
අජිත් ටයර් ට්‍රේඩර්ස්		2022 දෙසැ	287	2	1	0	1301		11				183,540.00			183,540.00

එන්.වී.ඔටෝ ඉංජිනියර්		2022 දෙසැ	287	2	1	0	1301		11				299,100.00			299,100.00
මෙට්‍රොපොලිටන් ටෙක්නොලජීස් පුද්ගලික සමාගම		2022 දෙසැ	287	2	1	0	1302		11				46,230.00			46,230.00
මෙට්‍රොපොලිටන් ටෙක්නොලජීස් පුද්ගලික සමාගම		2022 දෙසැ	287	2	1	0	1302		11				28,750.00			28,750.00
හීරෝ ස්ටේෂනරිස් පුද්ගලික සමාගම		2022 දෙසැ	287	2	1	0	1201		11				473,398.00			473,398.00
නිව් රේණුකා බැටරි වර්ක්ස්		2022 දෙසැ	287	2	1	0	2003		11				53,750.00			53,750.00
නිව් රේණුකා බැටරි වර්ක්ස්		2022 දෙසැ	287	2	1	0	2003		11				47,700.00			47,700.00
පී.එස්.ඩී.මෝටර් වර්ක්ස්		2022 දෙසැ	287	2	1	0	2003		11				113,700.00			113,700.00
කන්ස්ට්‍රක්ෂන් ටෙක්නොලොජීස් පුද්ගලික සමාගම		2022 දෙසැ	287	2	1	0	2509		11				222,600.00			222,600.00
ටී.ඒ.කේ.වන්දිකා		2022 දෙසැ	287	2	1	0	1003		11				11,903.75			11,903.75
ඩබ්.එම්.අයි.සඳමාලි		2022 දෙසැ	287	2	1	0	1003		11				15,648.75			15,648.75
කේ.එච්.එස්.යූ.යසනායක		2022 දෙසැ	287	2	1	0	1003		11				7,935.83			7,935.83
එම්.ජී.ජී.පී.ධර්මකීර්ති		2022 දෙසැ	287	2	1	0	1003		11				7,935.83			7,935.83
කේ.ජී.එච්.එන්.සංජීවනී		2022 දෙසැ	287	2	1	0	1003		11				4,500.00			4,500.00
ඩී.එම්.ඩබ්.එස්.බී.මියණදෙණිය සහ වෙනත්		2022 දෙසැ	287	2	1	0	1002		11				64,782.11			64,782.11
කේ.විජේසේකර සහ වෙනත්		2022 දෙසැ	287	2	1	0	1002		11				14,547.90			14,547.90
පී.ගමගේ		2022 දෙසැ	287	2	1	0	1001		11				2,142.90			2,142.90
ආර්.වී.සමරවික්‍රම		2022 දෙසැ	287	2	1	0	1001		11				13,068.71			13,068.71
එන්.ඩී.එන්.කේ.ද සිල්වා		2022 දෙසැ	287	2	1	0	1001		11				110,797.95			110,797.95

කේ.ඒ.සී.පී.ප්‍රේමකුමාර		2022 දෙසැ	287	2	1	0	1003		11				84,683.94			84,683.94
එකතුව													1,806,715.67			1,806,715.67

ගෙවීම්/බැඳීම්වල ස්වභාවය පහත සඳහන් ආකාරයට හඳුනාගත යුතු ය.

1. අමාත්‍යාංශ/රජයේ දෙපාර්තමේන්තු
2. රාජ්‍ය සංස්ථා/ව්‍යවස්ථාපිත මණ්ඩල
3. පෞද්ගලික අංශය

බැරකම් යනු අදාළ ගිණුම් වර්ෂය ඇතුළත භාණ්ඩ, සේවාවන් හෝ ඉදිකිරීම් කොන්ත්‍රාත්තුවලට අදාළ වත්කම් හා සේවාවන් ලැබී ඇති නමුත් ගිණුම් වර්ෂය තුළදී ඒ සඳහා අදාළ පාර්ශ්වයන්ට ගෙවීම් සිදුකර නොමැති ගනුදෙනුය.

බැඳීම් යනු අදාළ ගිණුම් වර්ෂය ඇතුළත භාණ්ඩ, සේවාවන් හෝ ඉදිකිරීම් කොන්ත්‍රාත්තු සම්බන්ධයෙන් අදාළ වත්කම් හෝ සේවාව ආයතනය වෙත ලැබී නොමැති, එහෙත් එකී භාණ්ඩ හා සේවාවන් ලබාගැනීමේ අරමුණින් බාහිර පාර්ශ්වයන් සමඟ එළඹ ඇති ගිවිසුම් හෝ ලිඛිත එකඟතාවයන්ය.

.....

ප්‍රධාන මූල්‍ය නිලධාරි/ ප්‍රධාන ගණකාධිකාරි/
අධ්‍යක්ෂ (මුදල්) /කොමසාරිස් (මුදල්)
දිනය : 2023.02.23

එන්. පී. පොන්නඩෝර
ප්‍රධාන ගණකාධිකාරි
ඉඩම් නිමකම් නිරවුල් කිරීමේ ව්‍යාපෘතිය
අංක. 1200/6, "මිහිතල මැදුර"
රජමල්වත්ත පාර.
බත්තරමුල්ල.

බැරකම් පිළිබඳ ප්‍රකාශය - (i)

මු.රෙ.94 (2) සහ (3) ප්‍රකාරව එළඹෙන ලද බැඳීම් ප්‍රකාශය

අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම : ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව

වියදම් ශීර්ෂ අංකය:287

වැඩසටහන් අංකය හා නාමය: වැඩසටහන 02

පුද්ගලයාගේ /ආයතනයේ නම	බැඳීම් පිළිබඳ විස්තරය	ව්‍යාපෘතිය	උප ව්‍යාපෘතිය	වැය විෂය සංකේතය	මූල්‍යකරණ සංකේතය	මු.රෙ. 94(2) හි සඳහන් ප්‍රතිපාදන අනුව එළඹිය හැකි උපරිම බැඳීම් සීමාව (රු.)	මු.රෙ. 94(3) අනුව මුල් පිරිවැය ඇස්තමේන්තු කුට (රු.)	බැඳීම් හා බැරකම් වර්ගීකරණ (රු.)
1. අමාත්‍යාංශ/රජයේ දෙපාර්තමේන්තු								
.....								XX
.....								XX
එකතුව								
2. රාජ්‍ය සංස්ථා /ව්‍යවස්ථාපිත මණ්ඩල								
.....								XX
.....								XX
එකතුව				අදාළ නොවේ				
3. වෙනත් (පෞද්ගලික අංශය)								
.....								XX
.....								XX
එකතුව								
මුළු එකතුව								

.....

ප්‍රධාන මූල්‍ය නිලධාරි/ ප්‍රධාන ගණකාධිකාරි/
අධ්‍යක්ෂ (මුදල්) /කොමසාරිස් (මුදල්)

එන්. පී. පෙරේරා
ප්‍රධාන ගණකාධිකාරි
ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ ව්‍යාපෘතාංශය
අංක. 1200/6, "මිහිකත මැදුර"
රත්මල්වත්ත පාර,
බිස්සමුල්ල.

දිනය : 2017.02.03

සටහන - (v)

බැරකම් පිළිබඳ ප්‍රකාශය - (ii)

මු.රෙ.215 (3) (ආ) සහ (ඇ) ප්‍රකාරව තැන්පත් ගිණුමට මාරු කරන ලද ප්‍රතිපාදන

අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම : ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව

වියදම් ශීර්ෂ අංකය : 287

වැඩසටහන් අංකය හා නාමය : වැඩසටහන 02

පුද්ගලයාගේ/ආයතනයේ නම (ප්‍රතිපාදන මාරු කරන විට හඳුනාගෙන තිබිය යුතුය)	වගකීම් පිළිබඳ විස්තරය	ණයවර ලිපි අංක ආදිය	ප්‍රතිපාදන මාරු කරනු ලැබුවේ කුමන වැය ශීර්ෂයකින්ද				තැන්පතු ගිණුම් අංකය	මාරුකරන ලද මුදල රු.
			ව්‍යාපෘතිය	උප ව්‍යාපෘතිය	වැය විෂය සංකේතය	මූල්‍යකරණ සංකේතය		
1. අමාත්‍යාංශ/රජයේ දෙපාර්තමේන්තු .... එකතුව								XX XX
2. රාජ්‍ය සංස්ථා /ව්‍යවස්ථාපිත මණ්ඩල .... එකතුව				අදාළ නොවේ				XX XX
3. වෙනත් (පෞද්ගලික අංශය) .... එකතුව								XX XX
මුළු එකතුව								

.....

ප්‍රධාන මූල්‍ය නිලධාරි/ ප්‍රධාන ගණකාධිකාරි/
අධ්‍යක්ෂ (මුදල්) /කොමසාරිස් (මුදල්)

දිනය : 2023

ප්‍රධාන ගණකාධිකාරි
ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව
අංක. 1200/6, "මිහිකත මැදුර"
රාජමල්වත්ත පාර.
බත්තරමුල්ල.

ප්‍රතිපූරණය කළ හැකි විදේශාධාරවලට අදාළ හිමිකම් පිළිබඳ ප්‍රකාශය

අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම : ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව

රු.

1	ප්‍රතිපූරණය කළ හැකි විදේශාධාර යටතේ, පරිපූරක වෙන්කිරීම්ද ඇතුළුව 2022 ඇස්තමේන්තුගත වෙන්කිරීම්	0
2	ඉහත (1) ට අදාළ 2022 වර්ෂය තුළදී දරන ලද මුළු වියදම	0
3	2022 ජනවාරි 01 දිනට ලැබීමට නියමිත තිබූ ප්‍රතිපූරණය කළ හැකි විදේශාධාරවලට අදාළ හිමිකම් පෑම්වල එකතුව	0
4	2021 හා ඊට පෙර වර්ෂවලට අදාළව, 2022 වර්ෂය තුළදී කරන ලද ප්‍රතිපූරණය කළ හැකි විදේශාධාරවලට අදාළ හිමිකම් පෑම්වල එකතුව (ඇත්නම්)	0
5	2022 වර්ෂය සම්බන්ධයෙන් 2022 වර්ෂය තුළදී කරන ලද ප්‍රතිපූරණය කළ හැකි විදේශාධාරවලට අදාළ හිමිකම් පෑම්වල එකතුව	0
6	2021 හා ඊට පෙර වර්ෂ වෙනුවෙන් වූ හිමිකම්පෑම් සම්බන්ධයෙන් 2022 වර්ෂයේදී ආධාර දෙන ආයතන විසින් ඉඩ නොදෙන ලද හිමිකම් පෑම්වල එකතුව	0
7	2022 වර්ෂය සම්බන්ධයෙන් 2022 වර්ෂය තුළදී ආධාර දෙන ආයතන විසින් ඉඩ නොදෙන ලද හිමිකම් පෑම්වල එකතුව	0
8	2021 හා ඊට පෙර වර්ෂ වෙනුවෙන් 2022 වර්ෂය තුළදී ලැබුණු ප්‍රතිපූරණවල මුළු එකතුව	0
9	2022 වර්ෂය වෙනුවෙන් 2022 වර්ෂය තුළදී ලැබුණු ප්‍රතිපූරණවල එකතුව	0
10	2022 දෙසැම්බර් 31 දිනට ලැබීමට නියමිතව තිබූ ප්‍රතිපූරණය කළ හැකි විදේශාධාරවලට අදාළ හිමිකම් පෑම්වල එකතුව (3+4+5) - (6+7) - (8+9)	0
11	මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර අවසන් වූ දිනය දක්වා 2022 වර්ෂය සම්බන්ධයෙන් 2022 දෙසැම්බර් 31 දිනෙන් පසුව කරන ලද ප්‍රතිපූරණය කළ හැකි විදේශාධාරවලට අදාළ හිමිකම් පෑම්වල එකතුව	0
12	මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර අවසන් වූ දිනය දක්වා 2022 දෙසැම්බර් 31 දිනෙන් පසුව ලැබුණු ප්‍රතිපූරණවල එකතුව	0
13	මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඉදිරිපත් කරන ලද දිනට ලැබීමට නියමිතව ඇති ප්‍රතිපූරණය කළ හැකි විදේශාධාරවලට අදාළ හිමිකම් පෑම්වල එකතුව (10 + 11 - 12)	0

.....

ප්‍රධාන මූල්‍ය නිලධාරී/ප්‍රධාන ගණකාධිකාරී/
අධ්‍යක්ෂ (මුදල්)/කොමසාරිස් (මුදල්)
දිනය : 2023/12/23

එන්. පී. පොන්නිහේවා
ප්‍රධාන ගණකාධිකාරී
ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව
අංක. 1200/6, "මිහිකත මැදුර"
රජමල්වත්ත පාර.
මත්තරමුල්ල.

සටහන - (vii)

අස්ථානගත වවුචර් පිළිබඳ ප්‍රකාශය

අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම : ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව
වියදම් ශීර්ෂ අංකය: 287
වැඩසටහන් අංකය හා නාමය : වැඩසටහන 02

දිනය	වවුචර් අංකය	ආදායකයාගේ නම	ගෙවීමේ ස්වභාවය	ගණන (රු)
		අස්ථානගත වවුචර් කිසිවක් නැත		

.....
ප්‍රධාන මූල්‍ය නිලධාරී/ප්‍රධාන ගණකාධිකාරී/
අධ්‍යක්ෂ (මුදල්)/කොමිසාරිස් (මුදල්)
දිනය : 2023/2/27

එන්. පී. තොන්නකෝන්
ප්‍රධාන ගණකාධිකාරී
ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව
අංක. 1200/6, "මිහිකත මැදුර"
රජමල්වත්ත පාර.
බත්තරමුල්ල.

2015/10/23 දින නිකුත් කරන ලද භාණ්ඩාගාර මෙහෙයුම් චක්‍රලේඛ අංක 2015/03 හි උපදෙස්වලට අනුකූලව ආරම්භ කරන ලද බැංකු ගිණුම් පිළිබඳ 2022.12.31 දිනට තත්ත්ව වාර්තාව

අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම : ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව
වියදම් ශීර්ෂ අංකය: 287

අනු අංකය	බැංකුවේ නම	ගිණුම් අංකය	2022.12.31 දිනට බැංකු ප්‍රකාශනය අනුව ශේෂය (රු.)	2022.12.31 දිනට මුදල් පොත අනුව ශේෂය (රු.)	2022.12.31 දිනට බැංකුවට ඉදිරිපත් නොකරන ලද චෙක්පත් එකතුව (මාස 6 ට වැඩි ඇතොත්)	අවසාන වරට බැංකු සැසඳුම් සකස් කළ මාසය
01	මහජන බැංකුව-බත්තරමුල්ල ශාඛාව	208-1002-59027251	12,550,588.99	0	0	2023 ජනවාරි

.....
ප්‍රධාන මූල්‍ය නිලධාරී/ප්‍රධාන ගණකාධිකාරී/
අධ්‍යක්ෂ (මුදල්)/කොමසාරිස් (මුදල්)
දිනය : 2023-02-23

එන්. පී. තෙන්නකෝන්
ප්‍රධාන ගණකාධිකාරී
ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව
අංක 1200/6, "මිහිකත මැදුර"
රාජමල්වත්ත පාර.
බත්තරමුල්ල.

3.5 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය

රු.

ආදායම් ක්ෂේත්‍රය	ආදායම් ක්ෂේත්‍රයේ විස්තරය	ආදායම් ඇස්තමේන්තුව		එකතු කරන ලද ආදායම	
		මුල් ඇස්තමේන්තුව	අවසන් ඇස්තමේන්තුව	ප්‍රමාණය (රු.)	අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස
අදාල නැත					

3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

රු.

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
	මුල් ප්‍රතිපාදන	අවසන් ප්‍රතිපාදන		
පුනරාවර්තන	**572,470,000.00**	**573,146,000.00**	**572,241,189.05**	**99.84**
ප්‍රාග්ධන	**9,500,000.00**	**9,500,000.00**	**6,553,210.50**	**68.98**

3.7 මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු වල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

රු.

අනු අංකය	ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව	ප්‍රතිපාදනයේ අරමුණ	ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
			මුල් ප්‍රතිපාදන	අවසන් ප්‍රතිපාදන		
1	ඉඩම් අමාත්‍යාංශය	බිම් සවිය වැඩසටහන ක්‍රියාත්මක කිරීම	**90,000,000.00**		**83,609,057.51**	**92.8**
2	රාජ්‍ය පරිපාලනය	දීමනා/ වැටුප් ගෙවීම	**80,259,804.00**		**79,251,051.90**	**98.74**
3	විශ්‍රාම වැටුප් දෙපා.	අත්තිකාරම් **B** ගිණුම ණය අය කර ගැනීම	**218,678.00**		**218,678.00**	**100**

3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

රු.

වත්කම් කේතය	කේත විස්තරය	31.12.2022 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය	31.12.2022 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය	ඉදිරියේ දී ගිණුම්කරණයට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැගිලි හා ව්‍යුහයන්		**36,400,000.00**		
9152	යන්ත්‍රෝපකරණ (වාහනද ඇතුලත්ව)		**228,779,287.84**		
9153	ඉඩම්		**-**		
9154	අස්පෘශ්‍ය වත්කම්		**-**		
9155	ජීව විද්‍යාත්මක වත්කම්		**-**		
9160	කෙරීගෙන යන වැඩ		**-**		
9180	බදු දෙන ලද වත්කම්		**-**		

3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව

(අවසන් වාර්තාවට ඇතුලත් වේ.)

පරිච්ඡේදය 04
කාර්ය සාධන දර්ශක

4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක

(I) 1998 අංක 21 දරණ පනතෙන් පැවරුන රාජකාරි

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම		
	100% - 90%	75% - 89%	50% - 74%
12 වගන්තිය යටතේ ගැසට් කිරීම	***		
බෙදා දුන් හිමිකම් අයදුම්පත් ගණන		87%	
හිමිකම් විමර්ශන පැවැත්වීම	****		
ඉ.රෙ.පරීක්ෂණ පැවැත්වීම			65%
14 වගන්තිය යටතේ තීරණ නිර්දේශ කිරීම හා අනුමත කිරීම	98%		
14 වගන්තිය යටතේ ගැසට් කිරීම	94%		
හිමිකම් සහතික පත්‍ර නිකුත් කිරීම සඳහා ඉඩම් රෙජිස්ට්‍රාර් වෙත උපලේඛන යැවීම			67%

*** 12 වගන්තිය යටතේ ගැසට් කිරීම, ඉහත පරාසයන්ට ඇතුළක් නොවන අතර එහි ප්‍රතිශතය 127%කි.
**** හිමිකම් විමර්ශන පැවැත්වීම, ඉහත පරාසයන්ට ඇතුළත් නොවන අතර එහි ප්‍රතිශතය 113%කි.

(II) 1931 අංක 20 දරණ පනතෙන් පැවරුන රාජකාරි

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම		
	100%-90%	75%-89%	50%-74%
උරුම විභාග පැවැත්වීම	-	60%	-
මැන වෙන් කිරීම පරීක්ෂා කර නිරවුල් කිරීමේ ආඥාව සඳහා විධානය සැකසීම	100%	-	-
නිරවුල් කරන ලද ඉඩම් සඳහා රේඛා සටහන් ඉල්ලුම් පත්‍ර පිළියෙල කර දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාල වෙතින් රේඛා චිත්‍ර ගෙන්වා ගැනීම	-	-	-
නිරවුල් කරන ලද ඉඩම් ලියාපදිංචි කිරීම සඳහා ඉඩම් රෙජිස්ට්‍රාර් වෙත යැවීම	-	50%	-
නිරවුල් කිරීමේ ආඥාව ඉඩම් විෂය භාර ගරු අමාත්‍යතුමාගේ අනුමැතියට යැවීම	-	50%	-
නිරවුල් කිරීමේ ආඥාව ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කිරීම	100%	-	-
නිරවුල් කිරීමේ ආඥා ප්‍රසිද්ධ කරන ලද ගැසට්පත් (ඔප්පු හා පිඹුරුපත්) උරුමකරුවන්ට බෙදාදීම	-	-	-
නිදහස් කරන ලද ගම් ගණන	***		

***ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් නොකළ නමුත් ඊට වැඩි ගම් ප්‍රමාණයක් නිදහස් කළ බැවින් මෙය 200%ක් වේ.

පරිච්ඡේදය 05
තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

5 1.හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු

ඉලක්කය / අරමුණු	ඉලක්කය	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රතිශතය		
			0% - 49%	50% - 74%	75% -100%
ස්ත්‍රී පුරුෂ භාවය සහ හිමිකම් මාදිලියට අනුව, නීත්‍යානුකූලව පිළිගත් ලිපි ලේඛන සහ සුරක්ෂිත ඉඩම් හිමිකම් සහිත මුළු වැඩිහිටි ජනගහනයේ ප්‍රමාණය	හිමිකම් සහතික නිකුත් කිරීම සඳහා තීරණ නිර්දේශ කිරීම හා අනුමත කිරීම	12 වගන්තිය යටතේ ගැසට් කිරීම	***		
		බෙදා දුන් හිමිකම් අයදුම්පත් ගණන			87%
		හිමිකම් විමර්ශන පැවැත්වීම	****		
		ඉ.රෙ.පරීක්ෂණ පැවැත්වීම		65%	
		14 වගන්තිය යටතේ තීරණ නිර්දේශ කිරීම හා අනුමත කිරීම			98%
		14 වගන්තිය යටතේ ගැසට් කිරීම			94%
		හිමිකම් සහතික පත්‍ර නිකුත් කිරීම සඳහා ඉඩම් රෙජිස්ට්‍රාර් වෙත උපලේඛන යැවීම		67%	

*** 12 වගන්තිය යටතේ ගැසට් කිරීම, ඉහත පරාසයන්ට ඇතුළක් නොවන අතර එහි ප්‍රතිශතය 127%කි.
**** හිමිකම් විමර්ශන පැවැත්වීම, ඉහත පරාසයන්ට ඇතුළත් නොවන අතර එහි ප්‍රතිශතය 113%කි.

5.2 තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග

- දැනට බිම් සවිය වැඩසටහන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 66ක ක්‍රියාත්මක වන අතර තවදුරටත් බිම් සවිය වැඩසටහන ව්‍යාප්ත කිරීමේ අරමුණින් ඉදිරියේදී ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 100 දක්වා වැඩි කිරීමට පියවර ගැනීම
- 1998 අංක 21 දරණ හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත සඳහා සංශෝධන ඇතුළත් කිරීමට පියවර ගැනීම.
- බිම්සවිය වැඩසටහනේ කාර්යක්ෂමතාව ඉහළ නැංවීමට දෙපාර්තමේන්තුව සතු මානව සම්පත් ප්‍රමාණවත් නොවීම.

පරිච්ඡේදය 06
මානව සම්පත් පැතිකඩ

6 1.සේවක සංඛ්‍යා කළමනාකරණය

තනතුර	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛාව	පවතින සේවක සංඛ්‍යාව (කොන්ත්‍රාත්)	ඇබෑර්තු/ අතිරික්ත
ජ්‍යෙෂ්ඨ	105	34	4	71
තෘතියික	7	5	0	2
ද්විතියික	1746	810	0	936
ප්‍රාථමික	254	142	0	112

6.2 ආයතනයේ කාර්ය සාධනය කෙරෙහි මානව සම්පත් හිඟයෙහි බලපෑම

මෙම දෙපාර්තමේන්තුව විසින් දිවයිනේ පිහිටි සියලුම ඉඩම්වල හිමිකම්, පිහිටීම හා ප්‍රමාණය නිශ්චිතව හා නිවැරදිව හඳුනා ගැනීමේ ජාතික අවශ්‍යතාව පෙරදැරි කරගෙන 1998 අංක 21 දරණ පනතේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රාදේශීය කාර්යාල 91 පිහිටුවීමට සැලසුම් කර ඇති අතර ඉන් 47ක් මේ වන විට පිහිටුවා හිමිකම් ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලිය සාර්ථකව සිදුකරමින් පවතී.

එසේ වුවද දැනට ක්‍රියාත්මක වන ප්‍රාදේශීය කාර්යාල සඳහා ජ්‍යෙෂ්ඨ මට්ටමේ නිලධාරීන්ගේ පුරප්පාඩුව හේතුවෙන් ප්‍රාදේශීය කාර්යාලවල පරිපාලනමය දුෂ්කරතා රැසකට මුහුණ දීමට සිදු වී ඇත. එසේම සහකාර කොමසාරිස් තනතුරේ නිලධාරීන් නොමැතිව නව කාර්යාල පිහිටුවීමට නොහැකි අතර කාර්යාල ආරම්භ නොකර ද්විතිය හා තෘතීය මට්ටමේ නිලධාරීන් අනුයුක්ත කර ගැනීමටද නොහැකි වී ඇත.

මෙසේ ස්ථීර සේවයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් දෙපාර්තමේන්තුව වෙත සපයා ගැනීමේ දුෂ්කරතාවය හේතුවෙන් කොන්ත්‍රාත් පදනම මත නිලධාරීන් බඳවා ගෙන පසුගිය වසර දක්වා දෙපාර්තමේන්තුවේ පරිපාලන කටයුතු පවත්වාගෙන ගියද රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්ගේ අංක PSC/APP/HB/01/2022 හා 2022.05.25 දිනැති ලිපිය මඟින් කොන්ත්‍රාත් පදනම මත බඳවා ගත් නිලධාරීන්ගේ සේවා කාලය දීර්ඝ කිරීම අත්හිටුවීම හේතුවෙන් නිලධාරීන් කිහිප දෙනෙකුගේ සේවය දීර්ඝ නොකිරීමට සිදු විය. නියෝජ්‍ය/ සහකාර කොමසාරිස් තනතුරු සඳහා නිලධාරී හිඟතාවය නව කාර්යාල ආරම්භ කිරීම සඳහා බාධාවක්ව පවතී. මේ සඳහා පිළියම් ලෙස දැනට දෙපාර්තමේන්තුගත නියෝජ්‍ය/ සහකාර කොමසාරිස්වරු මඟින් නිත්‍ය කාර්යාලවලට අමතරව වෙනත් ආසන්න කාර්යාලවල වැඩ බැලීම සඳහා පත් කිරීම හා සහකාර ප්‍රාදේශීය ලේකම්වරු හරහා වැඩ බැලීමේ රාජකාරී ඉටු කරගැනීමද සිදු කරයි.

එසේම තෘතීය මට්ටමේ නිලධාරීන්, විශේෂයෙන් පරිපාලන නිලධාරීන් පුරප්පාඩුව හේතුවෙන් ප්‍රධාන කාර්යාලයේ රාජකාරී ඉටු කිරීමේදී දුෂ්කරතා රැසක් ඇති වී ඇත. සෑම ප්‍රාදේශීය කාර්යාලයකටම කළමනාකරණ සේවා නිලධාරී සේවයේ නිලධාරීන් දෙදෙනෙකු බැගින් අනුයුක්ත කළ යුතු වුවුද නිලධාරී හිඟය නිසා කාර්යාල කිහිපයකටම එසේ නිලධාරීන් අනුයුක්ත කිරීමට නොහැකි වී ඇති අතර මෙම ගැටළුව ප්‍රධාන කාර්යාලයේද පවතී.

මෙම දෙපාර්තමේන්තුව සතුව මේ වන විට වාහන **41**ක් පවතින අතර රියදුරු සේවයේ රියදුරන් **37**ක් පමණක් දැනට සේවයේ නියුතු වේ. මේ හේතුවෙන් ප්‍රාදේශීය කාර්යාලවල ක්ෂේත්‍ර රාජකාරී කිරීමේදී බොහෝ දුෂ්කරතාවලට මුහුණ පෑමට සිදු වී ඇත. එසේම කාර්යාල කාර්ය සහයකවරුන්ගේ පුරප්පාඩු සඳහා බහු කාර්යය සංවර්ධන සහයකවරු **22**ක් බඳවා ගැනීමට කටයුතු කරමින් පවතී.

එබැවින් මෙම දෙපාර්තමේන්තුවේ අරමුණ හා ඉලක්ක වෙත ළඟා වීම සඳහා ආයතනයේ මානව සම්පත් හිඟය බලපාන බව හඳුනාගත හැක. එම නිසා අවශ්‍ය කාර්ය මණ්ඩලය මෙම දෙපාර්තමේන්තුව වෙත අනුයුක්ත කර ගැනීමට අවශ්‍ය කටයුතු කිරීමට පියවර ගෙන ඇත.

6.3 මානව සම්පත් සංවර්ධනය

වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාල සීමාව	සමස්ථ අයෝජනය (රු.)		වැඩසටහනේ ස්වභාවය /දේශීය) විදේශීය(	නිමැවුම ලබා ගත්/ දැනුම
			දේශීය	විදේශීය		
සහකාර හිමිකම් විමර්ශන නිලධාරීන් සඳහා බිම් සවිය පිළිබඳ වැඩමුළුව	**35**	**2022.01.18** පෙ.ව.**8.30** සිට ප.ව.**4.00** දක්වා	**15,000/=**	**-**	දේශීය	**1998** අංක **21** දරණ හිමිකම් නිරවුල් කිරීමේ පනත හා එහි සංශෝධන අනුව දෙපාර්තමේන්තු ක්‍රියාදාමය ක්‍රමවත්ව හා නිවැරදිව පවත්වාගෙන යාම පිළිබඳව දැනුම ලබා ගැනීම
කාර්යාල සේවක සේවයේ නිලධාරීන් සඳහා පුහුණු වැඩ සටහන	**109**	**2022.01.19** පෙ.ව.**8.30** සිට ප.ව.**4.00** දක්වා	**60,000/=**	**-**	දේශීය	රාජ්‍ය සේවය තුළ කාර්යාල කාර්ය සහායක භූමිකාවේ ඇති වැදගත්කම පිළිබඳ අවබෝධයක් ලබා ගැනීම

සහකාර හිමිකම් විමර්ශන නිලධාරී පුහුණු වැඩමුළුව අනුරාධපුර/මාතලේ දිස්ත්‍රික්ක	37	2022.01.20	42,125/=	-	දේශීය	පෞද්ගලික ඉඩම් අයිතිය පිළිබඳව අවසානාත්මක තීරණයක් ලබා දීම සඳහා වන නිවැරදි විමර්ශන වාර්තා ඉදිරිපත් කිරීමට අවශ්‍යවන දැනුම ලබා ගැනීම
සහකාර හිමිකම් විමර්ශන නිලධාරී පුහුණු වැඩමුළුව මහනුවර දිස්ත්‍රික්ක	55	2022.01.27	26,425/=	-	දේශීය	පෞද්ගලික ඉඩම් අයිතිය පිළිබඳව අවසානාත්මක තීරණයක් ලබා දීම සඳහා වන නිවැරදි විමර්ශන වාර්තා ඉදිරිපත් කිරීමට අවශ්‍යවන දැනුම ලබා ගැනීම
සමථකරණ හා විමර්ශන පැවැත්වීම හා පුහුණු වැඩමුළුව	47	2022.02.11 පෙ.ව.9.00 සිට ප.ව.3.30 දක්වා	12,000/=	-	දේශීය	1998 අංක 21 දරණ හිමිකම් නිරවුල් කිරීමේ පනත හා එහි සංශෝධන අනුව දෙපාර්තමේන්තු ක්‍රියාදාමය ක්‍රමවත්ව හා නිවැරදිව පවත්වාගෙන යාම පිළිබඳව දැනුම ලබා ගැනීම
ඉඩම් පුහුණු වැඩසටහන - රිදීමාලියද්ද	47	2022.02.15	12,940/=	-	දේශීය	1998 අංක 21 දරණ හිමිකම් නිරවුල් කිරීමේ පනත හා එහි සංශෝධන අනුව දෙපාර්තමේන්තු ක්‍රියාදාමය ක්‍රමවත්ව හා නිවැරදිව පවත්වාගෙන යාම පිළිබඳව දැනුම ලබා ගැනීම

සහකාර හිමිකම් විමර්ශන නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන	**440**	**2022.12.09** පෙ.ව.**9.30** සිට ප.ව.**2.00** දක්වා	**484,282/=**	**-**	දේශීය	හිමිකම් නිරවුල් කිරීමේ ක්‍රමවේද, නෛතික පසුබිම, **1998** අංක **21** දරණ හිමිකම් නිරවුල් කිරීමේ පනත හා එහි සංශෝධන පිළිබඳ අවබෝධය ලබා ගැනීම
දෙමළ භාෂා පාඨමාලාව - පැය **150**	**87**	**2022.09.26** සිට **2022.12.20** දක්වා පෙ.ව.**9.00** සිට	**112,500/=**	**-**	දේශීය	දෙමළ භාෂා හැකියාව ප්‍රවර්ධනය

ආයතනයේ කාර්ය සාධනය කෙරෙහි පුහුණු වැඩසටහන් වල දායකත්වය

මෙම දෙපාර්තමේන්තුවේ සහකාර හිමිකම් විමර්ශන නිලධාරීන් සඳහා **2022** වර්ෂයේ ලබා දෙන ලද පුහුණු වැඩසටහන් මඟින් **1998** අංක **21** දරණ හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත හා එහි සංශෝධන අනුව දෙපාර්තමේන්තු ක්‍රියාදාමය ක්‍රමවත්ව හා නිවැරදිව පවත්වා ගෙන යාම පිළිබඳව දැනුවත් කිරීමක්ද, පෞද්ගලික ඉඩම් අයිතිය පිළිබඳව අවසානාත්මක තීරණයක් ලබාදීම සඳහා වන නිවැරදි විමර්ශන වාර්තා ඉදිරිපත් කිරීමට අවශ්‍ය වන දැනුම ලබාගැනීමද, හිමිකම් නිරවුල් කිරීමේ ක්‍රමවේද, නෛතික පසුබිම, **1998** අංක **21** දරණ හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත හා එහි සංශෝධන පිළිබඳ අවබෝධය ලබාගැනීම යන පුහුණු වැඩසටහන් පවත්වන ලදි. මෙමඟින් පනතේ විධි විධාන පිළිබඳ පුළුල් විෂය දැනුමක් එම නිලධාරීන් වෙත ලබා දීමෙන් බිම් සවිය ඉඩම් නිරවුල් කිරීමේ ක්‍රියාවලිය සාර්ථකව සිදු කිරීමට අපේක්ෂා කරනු ලබයි.

එමෙන්ම මෙම දෙපාර්තමේන්තුවේ කාර්යාල සේවක සේවයේ නිලධාරීන් සඳහා රාජ්‍ය සේවය තුළ කාර්යාල කාර්ය සහයක භූමිකාවේ ඇති වැදගත්කම පිළිබඳ අවබෝධයක් ලබාගැනීම සඳහා පවත්වන ලද පුහුණු වැඩසටහන මඟින් කාර්යාල සේවක සේවයේ නිලධාරීන්ගේ විෂය දැනුම හා ආකල්පමය වර්ධනයක් තුළින් ආයතනයේ කාර්ය සාධනය වර්ධනය කරගැනීමට බලාපොරොත්තු වේ.

මෙම දෙපාර්තමේන්තුවේ සියලු නිලධාරීන් සඳහා දෙමළ භාෂා හැකියාව ප්‍රවර්ධනය සඳහා **2022** වර්ෂය තුළ දෙමළ භාෂා පාඨමාලාවක් සාර්ථකව පවත්වන ලදි.

පරිච්ඡේදය 07

අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
01	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශය	අනුකූල වේ		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්)	අනුකූල නොවේ		
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම්	අනුකූල නොවේ		
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම්	අනුකූල නොවේ		
1.6	වෙනත්	-		
02	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ.445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ **267/2018** අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.5	සියලුම මාසික ගිණුම් සාරාංශ **(CIGAS)** පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.8	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය **(GA-N20)** යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
03	**මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මු.රෙ.135)**			
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරාදී තිබීම	අනුකූල වේ		
3.2	මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම	අනුකූල වේ		
3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරාදී තිබීම	අනුකූල වේ		
3.4	**2014.05.11** දිනැති අංක **171/2004** දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල වේ		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
04	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට **(NBD)** නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
05	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියලුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම	අනුකූල වේ		
06	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ.**134(2) DMA/1-2019** අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම	අනුකූල නොවේ	ප්‍රාදේශීය කාර්යාලවල ප්‍රායෝගික ගැටළු නිසා විගණන විමසුම්වලට පිළිතුරු සැපයීමට මාසයකට වැඩි කාලයක් ගතවේ.	

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
6.3	**2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40 (4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම**	අනුකූල වේ		
6.4	**මුදල් රෙගුලාසි 134 (3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම**	අනුකූල වේ		
07	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	**DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම**	අනුකූල වේ		
08	**වත්කම් කළමනාකරණය**			
8.1	**අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිල දී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම**	අනුකූල වේ		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
8.2	**ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව,එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම**	අනුකූල වේ		
8.3	**රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2020 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම**	අනුකූල නොවේ	දෙපාර්තමේන්තු ප්‍රාදේශීය කාර්යාල 48ක් පවතින බැවින් සමීක්ෂණ කටයුතු දැනට අවසන් අදියරේ පවතී.	
8.4	**වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණයවූ අතිරික්ත, ඌනතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදු කොට තිබීම**	අනුකූල නොවේ	දෙපාර්තමේන්තු ප්‍රාදේශීය කාර්යාල 48ක් පවතින බැවින් සමීක්ෂණ කටයුතු දැනට අවසන් අදියරේ පවතී.	
8.5	**ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ.772 අනුව සිදු කිරීම**	අනුකූල වේ		
09	**වාහන කළමනාකරණය**			
9.1	**සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම**	අනුකූල නොවේ	නියමිත දිනට ලැබෙන ධාවන සටහන් සහ අඩුපාඩුවලින් තොර ධාවන සටහන් පරීක්ෂා කර විගණකාධිපති වෙත ඉදිරිපත් කරනු ලැබේ.	
9.2	**වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම**	අනුකූල නොවේ	ප්‍රායෝගිකව සිදුවන ක්‍රියාවලීන් සඳහා මාස 06කට වඩා වැඩි කාලයක් ගත වේ.	

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ.**103,104,109** හා **110** ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූල වේ		
9.5	**2016.12.29** දිනැති අංක **2016/30** දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ **3.1** ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම	අනුකූල නොවේ	රටේ පැවති ඉන්ධන හිඟතාවය සහ දෙපාර්තමේන්තු මූල්‍ය හිඟකම හේතුවෙන් ඉන්ධන පරීක්ෂාවන් සිදු කිරීමට නොහැකි වී ඇත.	
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම	අනුකූල වේ		
10	බැංකු ගිණුම් කළමනාකරණය			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
10.2	සමාලෝචිත වර්ෂයේදී හෝ ඊට පෙර වර්ෂවල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	අදාල නොවේ	අක්‍රිය බැංකු ගිණුම් නොමැත	
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
11	ප්‍රතිපාදන උපයෝජනය			

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ		
11.2	මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එලඹීම	අනුකූල වේ		
12	රජයේ නිළධාරින්ගේ අත්තිකාරම් ගිණුම			
12.1	සීමාවන් වලට අනුකූල වීම	අනුකූල වේ		
12.2	හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම	අනුකූල වේ		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම	අනුකූල නොවේ	*U.G.ජයවර්ධන 93,730/= විනය ක්‍රියාමාර්ග පවතී. *P.G.D.I.N.රණසිංහ 179,623/= සේවය හැර ගොස් ඇත. (නැවත සේවයේ පිහිටුවීමට කරුණු විමසමින් සිටී)	
13	පොදු තැන්පත් ගිණුම			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ.571 ප්‍රකාරව කටයුතු කර තිබීම	අනුකූල වේ		
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
14	අග්‍රිම ගිණුම			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූල වේ		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
14.2	මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
14.3	මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	අනුකූල වේ		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම	අනුකූල වේ		
15	ආදායම් ගිණුම			
15.1	අදාළ රෙගුලාසි වලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම	අනුකූල වේ		
15.2	රැස් කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට ඍජුවම ආදායමට බැර කර තිබීම	අනුකූල වේ		
15.3	මු.රෙ.176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
16	මානව සම්පත් කළමනාකරණය			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම	අනුකූල වේ		
16.2	කාර්ය මණ්ඩලයේ සියලුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම	අනුකූල වේ		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
16.3	**2017.09. 20** දිනැති **MSD** චක්‍රලේඛ අංක **04/2017** ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
17	මහජනයා වෙත තොරතුරු ලබා දීම			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/ චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම	අනුකූල නොවේ		
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ **08** වන හා **10** වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	අනුකූල නොවේ		
18	පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම			
18.1	අංක **05/2008** හා **05/2018 (1)** දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම	අනුකූල වේ		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
18.2	**එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම**	අනුකූල නොවේ		
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			
19.1	**2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම**	අනුකූල වේ		
19.2	**කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නො අඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම**	අනුකූල නොවේ		
19.3	**ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ථ කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම**	අනුකූල වේ		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම	අනුකූල වේ		
20	විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම	අනුකූල වේ		

ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව

නිරවුල් කිරීමේ නිලධාරින් / කොමසාරිස්වරුන්ගේ/ කොමසාරිස් ජනරාල්වරුන්ගේ නාම ලේඛනය

1903 – 1905	ජේ.ජී. ෆ්‍රේසර් මහතා
1906	එච්.ඕ. ෆොක්ස් මහතා (වැ.බ.)
1907 – 1912	ජේ.ජී. ෆ්‍රේසර් මහතා
1913	එච්.ඕ. ෆොක්ස් මහතා
1914	ජේ.එම්. ඩේවිස් මහතා (වැ.බ.)
1915 -1917	එච්.ඕ. ෆොක්ස් මහතා
1918	ජේ.එම්. ඩේවිස් මහතා (වැ.බ.)
1919 – 1920	එච්.ඕ. ෆොක්ස් මහතා
1921	ඩබ්ලිව්.ඊ. වේට් මහතා
1922 – 1923	එම්.එම්. වෙදර්බර්න් මහතා (වැ.බ.)
1924	එම්.ටී. ආච්බල්ඩ් මහතා (වැ.බ.)
1925	එෆ්. බාටලට් මහතා
1926 – 1927	එම්.ටී. ආච්බල්ඩ් මහතා (වැ.බ.)
1928	එම්.ටී. ආච්බල්ඩ් මහතා
1929 – 1930	ඩබ්ලිව්.ටී. ස්ටේස් මහතා
1931 – 1936	එච්.ඊ. ජෑන්ස් මහතා (වැ.බ.)
1937 – 1939	එච්.ඊ. ජෑන්ස් මහතා
1940	සී.එල්. වික්‍රමසිංහ මහතා
1941 – 1944	එච්.ඊ. ජෑන්ස් මහතා
1945 – 1947	සී.බී.පී. පෙරේරා මහතා (වැ.බ.)
1948 – 1950	සී.බී.පී. පෙරේරා මහතා
1951 – 1954	එම්.ඩබ්ලිව්.එෆ්. අබේකෝන් මහතා (වැ.බ.)
1955 – 1958	එම්.ඩබ්ලිව්.එෆ්. අබේකෝන් මහතා
1959	එස්.එල්. ද සිල්වා මහතා (වැ.බ.)
1960	ආර්.ටී. රත්නතුංග මහතා (වැ.බ.)
1961 – 1963	ආර්.ටී. රත්නතුංග මහතා
1964 – 1974	එස්.එල්. ද සිල්වා මහතා
1975 – 1978	සී.එස්. රණසූරිය මහතා
1979 – 1980	අයි.ඒ. එදිරිවීර මහතා
1981 – 1983	කේ.පී. විමලධර්ම මහතා
1984 – 1987	ආර්.ඩබ්ලිව්. පියසේන මහතා
1988	ඒ. බොරළුගොඩ මහතා (වැ.බ.)
1989	ඩී.ජී.පී. සෙනෙවිරත්න මහතා
1990 – 1993	ආර්.එම්.සී.පී. උඩුගම්පල මහත්මිය
1994	එච්. උඩකන්දගේ මහතා (වැ.බ.)
1995 - 1997	ආර්.එම්.සී.පී. උඩුගම්පල මහත්මිය
1997 – 2001	එච්. උඩකන්දගේ මහතා
2002 – 2003	එස්. එච්. විතානගේ මහතා
2004 – 2005	කේ.ඒ.ඩී.පී. පෝල් මහතා
2006 – 2008	පී.ඒ. මුතුකුමාරණ මහතා
2009 – 2010	ජී. විජිත නන්ද කුමාර් මහතා
2011	එල්.කේ. පේමරත්න මහතා
2012 - 2013	ඒ.එච්.එස්. විජේසිංහ මහතා
2013 - 2015	ගාමිණී ඉලංගරත්න මහතා
2015	ජී. විජිත නන්ද කුමාර් මහතා
2015 - 2018	කේ. ඒ. කේ. රංජිත් ධර්මපාල මහතා
2019 - 2022.09.28	පී.එම්.එච්. ප්‍රියදර්ශනී මහත්මිය
2022.09.29 සිට මේ දක්වා	පී.ජී.ඩී.සිගේරා මහත්මිය

ක.සේ.නි. - කළමනාකරණ සේවා නිලධාරී
ස.හි.වි.නි. - සහකාර හිමිකම් විමර්ශන නිලධාරී
ලේ.වි.නි. - ලේඛන විමර්ශන නිලධාරී
ලේ.ස. - ලේඛන සංරක්ෂක
සං.නි. - සංවර්ධන නිලධාරී
තො.ස.තා.නි. - තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරී
කා.කා.ස. - කාර්යාල කාර්ය සහායක

ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුවේ සංවිධාන සටහන

ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ කොමසාරිස් ජනරාල්
ශ්‍රී.ලං.ප.සේ.විශේෂ ශ්‍රේණිය
(ගණන් දීමේ නිලධාරී හා ප්‍රධාන පරිපාලන නිලධාරී)

- කොමසාරිස් (දිස්ත්‍රික්) ශ්‍රී.ලං.ප.සේ. I පන්තිය
- කොමසාරිස් (ඉඩම්) ශ්‍රී.ලං.ප.සේ. I පන්තිය (ඉඩම් නිරවුල් කිරීම හා සම්බන්ධ සියලු කටයුතු)
  - නියෝජ්‍ය/සහකාර කොමසාරිස් (ඉඩම්) ශ්‍රී.ලං.ප.සේ. II/III
    - ඉඩම් අංශය
      - ප්‍රධාන ක.සේ.නි
        - ක.සේ.නි./සං.නි.
          - කා.කා.ස
      - ලේ.වි.නි.
        - ලේ.ස.
          - කා.කා.ස.
    - ලේඛනාගාරය
      - ලේ.වි.නි.
        - ලේ.ස.
          - කා.කා.ස.
  - නියෝජ්‍ය/සහකාර කොමසාරිස් (පාලන) ශ්‍රී.ලං.ප.සේ. II/III
    - පරිපාලන නිලධාරී
      - ප්‍රධාන ක.සේ.නි
        - ක.සේ.නි./සං.නි.
          - කා.කා.ස
          - රියදුරු
    - භාෂා පරිවර්තක
- නීති නිලධාරී
  - ක.සේ.නි./සං.නි.
    - කා.කා.ස
- නියෝජ්‍ය/සහකාර කොමසාරිස් (විමර්ශණ) ශ්‍රී.ලං.ප.සේ. II/III පන්තිය
  - විමර්ශන අංශය
    - ස.හි.වි.නි/සං.නි.
      - ක.සේ.නි
        - කා.කා.ස
- නියෝජ්‍ය/සහකාර කොමසාරිස් (පරිගණක/සැලසුම්/ප්‍රකාශන) ශ්‍රී.ලං.ප.සේ. II/III පන්තිය
  - පරිගණක අංශය
    - තො.සං.තා.නි.
      - ක.සේ.නි./සං.නි./තො.සං.තා.ස.
        - කා.කා.ස
  - ප්‍රකාශන අංශය
    - ප්‍රධාන ක.සේ.නි
      - ක.සේ.නි./සං.නි./තො.සං.තා.ස.
        - කා.කා.ස
  - සැලසුම් අංශය
    - ප්‍රධාන ක.සේ.නි
      - ක.සේ.නි./සං.නි./තො.සං.කා.ස.
        - කා.කා.ස
- නියෝජ්‍ය/සහකාර කොමසාරිස් (ප්‍රා.කාර්යාල) ශ්‍රී.ලං.ප.සේ. II/III පන්තිය
  - ස.හි.වි.නි /සං.නි
    - ක.සේ.නි./තො.සං.තා.ස.
      - කා.කා.ස
      - රියදුරු
- කොමසාරිස් (බිම් සවිය/විමර්ශණ) ශ්‍රී.ලං.ප.සේ. I පන්තිය (ඉඩම් හිමිකම් නිරවුල් කිරීම හා සම්බන්ධ කටයුතු)
- කොමසාරිස් (පාලන) ශ්‍රී.ලං.ප.සේ. I පන්තිය (සාමාන්‍ය පරිපාලන කටයුතු)
- ප්‍රධාන ගණකාධිකාරී ශ්‍රී.ලං.ග.සේ. I පන්තිය
  - ගණකාධිකාරී (ප්‍රසම්පාදන) ශ්‍රී.ලං.ග.සේ. II/III පන්තිය
    - ප්‍රසම්පාදන අංශය
      - ප්‍රධාන ක.සේ.නි
        - ක.සේ.නි./සං.නි./
          - කා.කා.ස
  - ගණකාධිකාරී (ගිණුම්) ශ්‍රී.ලං.ග.සේ. II/III පන්තිය
    - ගිණුම් අංශය
      - ප්‍රධාන ක.සේ.නි
        - ක.සේ.නි./සං.නි./
          - කා.කා.ස
    - සරප්
- අභ්‍යන්තර විගණක ශ්‍රී.ලං.ග.සේ. I පන්තිය
  - ක.සේ.නි
    - කා.කා.ස

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය
எனது இல.
My No. ARI/E/LSD/FA/2/22/03

ඔබේ අංකය
உமது இல.
Your No.

දිනය
திகதி
2023 මැයි 29 දින



ගණන්දීමේ නිලධාරී
ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව

ශීර්ෂය 287 - ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුවේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 agf@auditorgeneral.gov.lk www.naosl.gov.lk

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායී ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම් නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම් හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, වියාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මහ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමග අනුරූප වේ.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

2. මූල්‍ය සමාලෝචනය

2.1 වියදම් කළමනාකරණය

(අ) දෙපාර්තමේන්තුව වෙත වැය විෂයය 1701- පාඩු හා කපා හැරීම් යටතේ රු. 50,000 ක ප්‍රතිපාදන වෙන්කර තිබුණද සමාලෝචිත වර්ෂයේදී ඒ සඳහා වූ සම්පූර්ණ ප්‍රතිපාදනයම උපයෝජනය කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ මූලධන වැය විෂයන් 02 කට සංවර්ධන කාර්යයන් ඉටු කිරීමට වෙන් කළරු.2,584,264 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබූ අතර එම ඉතිරිය ප්‍රතිශතයක් ලෙස සියයට 30 ත් 54 ත් අතර පරාසයක් ගෙන තිබුණි.

(ඇ) දෙපාර්තමේන්තුවට සමාලෝචිත වර්ෂයේදී රු.90,000,000 ක ප්‍රතිපාදන සංචාරක හා ඉඩම් අමාත්‍යාංශයෙන් ලැබී රු. 75,980,647 ක් පුද්ගල පඩිනඩි, ගමන් වියදම්, සැපයීම්, නඩත්තු වියදම්, සේවා යන පුනරාවර්තන වියදම් වෙනුවෙන් දරා තිබුණි. එම ප්‍රතිපාදන සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කර නොතිබුණි.

2.2 බැරකම් හා බැඳීම්වලට එළඹීම.

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන සටහන් අංක (iii) අනුව බැඳීම් හා බැරකම් වල එකතු වටිනාකම රු.1,832,687 ක් වුවත් භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත සටහන් අනුවඑය රු.262,150 ක් වුයෙන් රු.1,570,537 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ආ) මුදල් රෙගුලාසි 94 හා 2017 අප්‍රේල් 22 දිනැති අංක 255/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 2(ඇ) ඡේදයට පටහැනිව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික ප්‍රතිපාදන ඉක්මවා වැය විෂයන් හතරකට අදාළව එකතුව රු. 825,273 ක බැරකම් වලට බැඳී තිබුණි.

(ඇ) සංචාරක හා ඉඩම් අමාත්‍යාංශයඑකතුව රු.458,331ක් වූ බැරකම් 2023 වර්ෂයේ මුල් කාර්තුව තුළදී එම අමාත්‍යාංශවැය ශීර්ෂය යටතේ ගෙවා තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශනවල එම බැරකම් අඩුවෙන් පෙන්වා තිබුණි.

2.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම.

නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත සඳහන් පරිදි වේ.

නීති රීති රෙගුලාසිය	අනුකූල නොවීම
(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ xxiv පරිච්ඡේදයේ 4.5 හා 4.6 වගන්ති	2021 ඔක්තෝබර් 05 දින සේවය හැරගිය නිලධාරියකුගෙන් අයවිය යුතු රු.179,623 ක් සහ 2016 දෙසැම්බර් 30 දින වැඩ නහනමට ලක් කරන ලද නිලධාරියකුගෙන් වර්ෂ 05 කට වැඩි කාලයක සිට අයවිය යුතු රු. 93,730 ක ණය ශේෂයන් සම්බන්ධයෙන්ආයතන සංග්‍රහය ප්‍රකාරව ඇපකරුගෙන්හෝඋරුමක්කාරයන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.
(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය	
i. මු.රෙ.104(3)	පාඩු හෝ අලාභ හානි සම්බන්ධයෙන් පරිපූර්ණ වාර්තාවක් ඉදිරිපත් කිරීමට දින 07 කට වඩා ප්‍රමාද වේ නම් ප්‍රාරම්භක වාර්තාවක් වහාම එවිය යුතු වුවද 2022 මැයි 28 දිනසහ 2022 මැයි 30 දින අනතුරටපත්වූ අංක PF 7866 සහඅංක PC 2375 දරන වාහන සම්බන්ධයෙන් විගණිත දිනය වූ 2023 මාර්තු 14 දින වන විටත් ප්‍රාරම්භක හා පරිපූර්ණ වාර්තා ඉදිරිපත් කර නොතිබුණි.
ii. මු.රෙ.1645(අ)	වාහන 41කට අදාළ ලොග් සටහන් පොත් යාවත්කාලීන කර පවත්වා නොතිබුණි.
(ඇ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ	
i. 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන චක්‍රලේඛයේ 3.1 ඡේදය	සෑම ඉන්ධන පරීක්ෂාවකටම පසු මාස 12 ක කාල සීමාවකින් හෝ කිලෝ මීටර් 25,000 ක දුර ප්‍රමාණයක් ධාවනය කිරීමෙන් පසුව හෝ එන්ජිම සම්බන්ධ ප්‍රධාන අලුත්වැඩියාවකට පසුව හෝ යන කාරණා අතුරින් මුලින් යෙදෙන අවස්ථාවට පසුව නැවත ඉන්ධන පරීක්ෂාවක් කර නොතිබුණි.
ii. 2018 ජනවාරි 24 දිනැති 05/2018 (1) දරන චක්‍රලේඛයෙන් සංශෝධිත 2008 පෙබරවාරි 06 දිනැති අංක 05/2008 දරන චක්‍රලේඛය	පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තියක් පිළියෙල කර නොතිබුණි.
iii. 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන චක්‍රලේඛනයේ ඇමුණුම් 02 ආකෘතිය	මානව සම්පත් සැලැස්ම පිළියෙල කර නොතිබුණි.

iv.	2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන චක්‍රලේඛයේ ඇමුණුම් 01 ආකෘතිය	2018 වර්ෂයේ පටන් කාර්ය සාධන ගිවිසුම් අත්සන් කිරීම සිදුකල යුතු වුවත් 2022 දෙසැම්බර් 31 දින වන විටත් කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර නොතිබුණි.

(ඇ) රාජ්‍ය මුදල් චක්‍රලේඛ

2019 දෙසැම්බර් 17 දිනැති අංක 08/2019 චක්‍රලේඛයේ 2.1 වගන්තිය	සියළුම රාජ්‍ය ආයතන විසින් විද්‍යුත් ප්‍රසම්පාදනය සඳහා (Electronic Government Procument (E.G.P) Secretariat) 2020 ජනවාරි 31 දිනට පෙර ලියාපදිංචි විය යුතු වුවත් දෙපාර්තමේන්තුව විසින් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් මෙම විද්‍යුත් ප්‍රසම්පාදනය සඳහා ලියාපදිංචි වී නොතිබුණි.

2.4 බැංකු ගිණුම් මෙහෙයවීම

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පිළියෙල කල බැංකු සැසඳුම් ප්‍රකාශයෙහි එකතුව රු.48,558 ක් වූ ලැබීම් හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්යසාධනය.

3.1.1 සැලැසුම් කිරීම.

1998 අංක 21 දරන ගිම්කම් නිරවුල් කිරීමේ පනත සම්මත වීමෙන් අනතුරුව දිස්ත්‍රික්ක 03 ක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 03 ක ආරම්භ කර ඇති බිම් සවිය වැඩ සටහන සමාලෝචිත වර්ෂයේදෙසැම්බර් 31 වන විට දිස්ත්‍රික්ක 18 ක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 66 ක එම කටයුතු ආවරණය වන ලෙස ක්‍රියාත්මක වුවත් අනෙකුත් දිස්ත්‍රික්ක ඇතුළත්ව ශ්‍රී ලංකාවම ආවරණය වන පරිදි මෙම වැඩසටහන ක්‍රියාත්මක කල හැකි කාල රාමුවක් ඇතුළත්ව ක්‍රියාකාරී සැලසුමක් සකස් කර නොතිබුණි.

3.1.2 කාර්ය භාරයන් ඉටු නොකිරීම.

(අ) 2007 වර්ෂයේ සිට ඉඩම් අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වූ බිම්සවිය වැඩ සටහන සඳහා සමස්ත පිරිවැය රු.මිලියන 5,911.05 ක් වැයකර එම ආරම්භ කල කටයුතු සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අවසන් කිරීමට අපොහොසත් වී තිබුණි.පහත දුර්වලතා නිරීක්ෂණය විය.

i. 1998 බලංගොඩ, දිවුලපිටිය, උඩපළාත යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ වල ද 2002 දී හෝමාගම හා තඹුත්තේගම යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ වල ක්‍රියාත්මක කර වසර 19 ත් 22 ක් අතර කාලයක් ක්‍රියාත්මක වුවත් ඒවා අවසන් කර නොතිබුණි.

ii. මෙම වැඩසටහනආරම්භ කර වර්ෂ 16 ක් තුළදි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 66 කට අදාළව මුළු ග්‍රාම නිලධාරී කොට්ඨාශ සංඛ්‍යාව 3971 ක් පැවතියද, ඉන් 1468 ක පමණක් එනම් සියයට 37 ක පමණක් මැනුම් අවසන් කර නිබුණි. එසේම කොට්ඨාශ 9 කට අයත් ග්‍රාම නිලධාරී කොට්ඨාශ 207 ක මැනුම් කටයුතු 2022 දෙසැම්බර් 31 දින වන විටත් ආරම්භ කර නොතිබුණි.

iii. 2017 වර්ෂයේදී ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 57 ක ක්‍රියාත්මක වී නිබුණු බිම් සවිය වැඩසටහන සමාලෝචිත වර්ෂය වන විට 66 ක් දක්වා කාර්යාල 09 කින් වර්ධනය වී ඇති අතර, එය රත්නපුර,කොළඹ,මහනුවර, පොළොන්නරුව, පුත්තලම, ගාල්ල ,මාතර යන දිස්ත්‍රික්ක 07 කට පමණක් සීමා වී නිබුණි. එසේම 2017 වර්ෂයේදී නුවරඑළිය, මොණරාගල, කැගල්ල, යාපනය යන දිස්ත්‍රික්ක වල මෙම වැඩ සටහන ආරම්භ කර නිබුණද සමාලෝචිත වර්ෂයදක්වා වසර 05 ක කාලයක් ගත වුවද එක් ප්‍රාදේශීය කාර්යාලය බැගින් පවත්වා ඇතත් සමස්ත බිම් සවිය වැඩසටහන ව්‍යාප්ත වීමේ ප්‍රගතිය පහළ මට්ටමක පැවතුණි.

(ආ) දෙපාර්තමේන්තුවේ බිම්සවිය වැඩසටහන සඳහා දිවයින පුරා ප්‍රාදේශීය කාර්යාල 48 ක් සඳහා ගොඩනැගිලි කුලී හා ආරක්ෂක වියදම් වෙනුවෙන් 2017 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා එකතුව රු.271,345,483 ක් ගෙවීම් කර තිබූ අතර 2022 අප්‍රේල් 26 දිනැති ජාතික අයවැය වක්‍රලේඛ අංක 03/2022 ප්‍රකාරව රජයේ ගොඩනැගිල්ල අදාළ කාර්යාලය පැවැත්වීමට කටයුතු නොකර සමාලෝචිත වර්ෂය තුළ පමණක් ගොඩනැගිලි කුලී හා ආරක්ෂක වියදම් ලෙස රු.50,500,200 ක් දරා තිබූ බව නිරීක්ෂණය විය.

(ඇ) 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතේ 12 වගන්තිය යටතේසමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දක්වා ගැසට් කළ මුළු කැබලි සංඛ්‍යාව වූ 1,561,909 න් සියයට 57 ක් හෙවත් කැබලි 898,125 ක් හිමිකම් නිරවුල් කිරීමේ කොමසාරිස් විසින් අනුමත කර නිබුණද, සියයට 43 ක් මෙතෙක් අනුමත කිරීමට නොහැකි වී ඇති බව නිරීක්ෂණය විය.

(ඈ) බිම් සවිය වැඩසටහනේ ආරම්භයේ සිට මැනුම් කරන ලද ඉඩම් වලට පැන නැගී ඇති නීතිමය ගැටලු, හිමිකම් ගැටලු, මායිම් ගැටලු මෙන්ම, ප්‍රවේශ මාර්ග පිළිබඳ ගැටලු, හිමිකම් නිරවුල් කිරීමේ ආඥා පනත යටතේ නිරවුල් නොකළ ඉඩම් පැවතීම, විහාර දේවාලගම් පනත යටතේ විරෝධතා ඇතුලු විවිධ ගැටළු වර්ග 11 ක් හේතුවෙන් හිමිකම් සහතිකය නිකුත් කිරීම සඳහා ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට නොහැකිව ප්‍රාදේශීය කාර්යාල65 ක පසෙක තබා ඇති මුළු ගොනු සංඛ්‍යාව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට 472,773 ක් වී නිබුණි. මෙම ප්‍රමාණය මෙතෙක් මැනුම් කර ගැසට් කර ඇති මුළු බිම් ප්‍රමාණය වූ 1,561,909න් සියයට 30 ක් පමණ වූ අතර දෙපාර්තමේන්තු විසින් පසෙක තබා ඇතිගොනු සම්බන්ධයෙන් පසු විපරම් කටයුතු කිරීම නිසියාකාරව සිදුනොවන බව නිරීක්ෂණය විය.

(ඉ) 2017 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා පසුගිය වසර 06 තුළ පසෙක තබන ලද එකතුව 167,322 ක් වූ ඉඩම් කැබලි සංඛ්‍යාවෙන් නැවත විසඳුම් ලබා දී නිරණ ගන්නා ලද ඉඩම් කැබලි සංඛ්‍යාව 58,823 ක් වූ අතර එහි ප්‍රගතිය 35% ක් විය. මෙය බිම්

සවිය වැඩසටහනෙහි අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීමට බාධාවක් වී ඇති අතරම මහජනයාගේ ඉඩම් අයිතිය නිරවුල් කිරීම ප්‍රමාද වීම දැඩි ලෙස බලපා තිබුණි.

(ඊ) 2020 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂයේදෙසැම්බර් 31 දක්වා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 20 ක ඉඩම් රෙජිස්ට්‍රාර්ට යැවූ ඉඩම් කැබලි සංඛ්‍යාව හා ලැබුණු සහතිකපත් සංඛ්‍යාව පිළිබඳ තොරතුරු අනුව මෙම කාල පරාසය තුළ ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලය වෙත බිම් කැබලි 42,833 ක් යවා තිබූ අතර ලද සහතික පත් සංඛ්‍යාව 22,524 ක් විය. එම කාර්යාල අතුරින් තඹුත්තේගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ඉඩම් කැබලි 780 ක් යවා තිබුණද, කිසිදු සහතිකයක් ලැබී නොතිබුණු අතර තිස්සමහාරාමය, හිගුරක්ගොඩ යන කොට්ඨාශ වලද සහතික ලැබීම ප්‍රගතිය ඉතා පහළ අගයක පැවතුණි.

(උ) ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලද හිමිකම් සහතිකපත් සංඛ්‍යාවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිමිකරුවන් වෙත බෙදා නොදී අත ඉතිරි හිමිකම් සහතික ප්‍රමාණය 24,898ක් වුවත් මෙම ඉතිරිව පවතින සහතිකපත් සංඛ්‍යාව පිළිබඳව එක් එක් ප්‍රාදේශීය කාර්යාල වලින් කාල විශ්ලේෂණයක් ගෙන්වා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඌ) හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව සතුව බිම් සවිය වැඩසටහන සම්බන්ධ දත්ත ඇතුළත් තොරතුරු පද්ධතියක් මෙතෙක් පිහිටුවා නොමැති වීම හේතුවෙන් ඉඩම් රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුයේ ස්ථාපිත කර ඇති e – land register මෘදුකාංගය සමඟ ඒකාබද්ධ වී හිමිකම් විමර්ශන ක්‍රියාවලියේදී ඉඩම් ලේඛන, පත්තිරු පරීක්ෂා කිරීමේ පහසුකම් ලබා ගැනීමටද මෙතෙක් දෙපාර්තමේන්තුව අපොහොසත් වී ඇතත් ඒ සඳහා කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(එ) 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතේ 7(1) වගන්තියේ සඳහන් පරිදි නිශ්චිතව සඳහන් යම් ප්‍රදේශයක් තුළ වූ එක් එක් ග්‍රාම නිලධාරී කොට්ඨාශයක් සඳහා හිමිකම් නිරවුල් කිරීමේ කොමසාරිස්වරයා විසින් සමගි මණ්ඩලයක් පත් කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට බිම් සවිය වැඩසටහන ක්‍රියාත්මක දිස්ත්‍රික්කවල ග්‍රාම නිලධාරී කොට්ඨාශ 3971 න් 315 කට පමණක් සමඟි මණ්ඩල පත් කර තිබුණු අතර, ඉතිරි ග්‍රාම නිලධාරී කොට්ඨාශ 3,656 ක සමඟි මණ්ඩල පත් කිරීමට කටයුතු කර නොමැති වීම සමස්ත ප්‍රගතිය අඩු වීමට හේතු වී ඇති බව නිරීක්ෂණය විය.

3.2 වත්කම් කළමනාකරණය

(අ) රු.36,400,000 ක් වූ දෙපාර්තමේන්තුවට අයත් කොමසාරිස් ජනරාල්වරයාගේ බත්තරමුල්ලේ පිහිටි නිල නිවස මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙහි දේපල පිරියත සහ උපකරණ යටතේ ඇතුලත් කර ඇතත් එම නිල නිවස පිහිටි හෙක්ටයාර් 0.0612 ක් වූ ඉඩමෙහි වටිනාකම මූල්‍ය තත්ත්ව ප්‍රකාශය මඟින් ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) එක්සත් ජාතීන්ගේ ලෝක ආහාර හා කෘෂිකර්ම සංවිධානය යටතේ ලියාපදිංචි කර තිබුණු 65-0748 දරන ලෑන්ඩ්රෝවර් ඩිපෙන්ඩර් රථය ලොග් සටහන් පොත අනුව 2007 වර්ෂයේ සිට මෙම දෙපාර්තමේන්තුව යටතේ රාජකාරී සඳහා යොදාගෙන

නිබුණද, අදාළ අයිතිය පවරා ගැනීමට මෙම වාර්තාවේ දිනය වන විටත් කටයුතු කර නොතිබුණි.

(ඇ) බත්තරමුල්ල, රජමල්වත්තේ පිහිටි කොමසාරිස් ජනරාල් නිල නිවසේ කොමසාරිස් ජනරාල් පදිංචි නොමැති හෙයින් එම නිල නිවසේ සහයකයින් සඳහා වෙන්කර ඇති කොටස තාවකාලිකව දෙපාර්තමේන්තුවේ පරිපාලන නිලධාරී වෙත 2020 සැප්තැම්බර් 01 දින සිට 2022 ජනවාරි 27 දින දක්වා තාවකාලිකව වෙන්කර පසුව ඉවත්වී තිබුණද අදාළ ඉන්වෙන්ටරි නිසි පරිදි භාර ගැනීමකින් තොරව මෙම නිල නිවස වසා දමා තිබෙන බව නිරීක්ෂණය විය.

(ඈ) අංක 53- 0049 දරන රථය 2018 පෙබරවාරි 01 වන දින සිට දෙපාර්තමේන්තු රථ ගාලේ ගාල් කර 2020 ජූලි 09 දින පත් කල වාහන හදුනා ගැනීමේ විශේෂ සමීක්ෂණ මණ්ඩලයක් විසින් අපහරණය කිරීම සුදුසු බවට නිර්දේශ කර තිබුණි. ඒ අනුව 2015.07.10 දිනැති අංක 02/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව අපහරණය කටයුතු නොකර 2022 මාර්තු 25 වන දින මෙම රථය ලක්දිව ඉංජිනේරු පුද්ගලික සමාගම වෙත වාහන අළුත්වැඩියා කිරීමේ හැකියාවක් පවතී ද යන්න පරීක්ෂා කිරීම සඳහා රැගෙන ගොස් තිබුණද මෙම වාර්තාවේ දිනය වන 2023 මාර්තු 13 දින දක්වා වාහනය අළුත්වැඩියා කර හැකිද නොහැකිද යන්න දන්වා නොමැති අතර වාහනය නැවත භාරදීමක් සිදු වී ද නොතිබුණි.

(ඉ) අංක 32 – 3129 දරන කැබ රථය අළුත්වැඩියා කිරීම සඳහා මිල ගණන් කැඳවීම 2021 නොවැම්බර් 15 දින සිදුකර ඇය ජී.එස්.ඩී.මෝටර්ස් වෙතින් අළුත්වැඩියාව සිදු කිරීමට ජනාධිපති ලේකම් කාර්යාල (යාන්ත්‍රික ඉංජිනේරු) වෙතින් ඒ සඳහා නිර්දේශය ලැබී තිබුණද 2023 මාර්තු13 දින වන විටත් අදාල අළුත්වැඩියාව සිදුකර නොතිබුණි.

(ඊ) අංක KH – 5711 ජීප් රථයෙහි එන්ජිමේ සම්පූර්ණ අළුත්වැඩියාවක් 2021 මාර්තු 01 වන දින සිදුකර පළමු සේවාව සඳහා 2021 අගෝස්තු 09 වන දින නැවත එම ආයතනයට රථය භාර දී ඇතත් විගණිත දිනය වන 2023 මාර්තු 15 වන දින වන විට වසර 01 මාස 07 ක් ගත වී ඇතත් වාහනය නැවත දෙපාර්තමේන්තුව වෙත ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(උ) අංක PF 7885 දරන වාහනයේ අළුත්වැඩියාවට රු.182,696 ක් 2021 දෙසැම්බර් 29 දින ගෙවා තිබුණි. තවද මෙම අළුත්වැඩියාව සඳහා ජපන් අමතර කොටස් යොදා ගන්නා බව ඇස්තමේන්තුවේ දක්වා තායිලන්ත අමතර කොටස් භාවිතා කර එය සිදු කර ඇති බවට 2021 දෙසැම්බර් 28 දින රියදුරු විසින් දන්වා තිබුණද, අළුත්වැඩියාවට සම්බන්ධ ලිපිගොනුව අස්ථානගත වීම මත අදල කරුණ සම්බන්ධව පරීක්ෂාවක් සිදු නොකිරීම පිළිබඳව එම වගකිව යුතු නිලධාරීන්ට එරෙහිව කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

3.3 රජයේ නිලධාරීන් ඇප තැබීම

2020 අගෝස්තු 28 දිනැති අංක 1/2020 දරන චක්‍රලේඛයප්‍රකාරව රජයේ මුදල්, ආදායම් මුද්දර හෝ බඩු බාහිරාදිය භාර ගැනීම හෝ භාරව සිටීම එසේ නැතහොත් රජයේ මුදල් බෙදා හැරීම හෝ බඩු බාහිරාදිය නිකුත් කිරීම සම්බන්ධව පරිපාලනමය වශයෙන් වගකිව යුතු නිලධාරීන් පිළිබඳව තොරතුරු දෙපාර්තමේන්තුව විසින් පවත්වාගෙන යා යුතුය. එසේ ඇප තැබිය යුතු

නිලධාරීන් 75 ක් දෙපාර්තමේන්තුව තුළ සිටියද ඇප තබා ඇති නිලධාරීන් ගණන 5 ක් විය.

3.4 කළමනාකරණ දුර්වලතා

(අ) උතුරු හා නැගෙනහිර පලාත්වලප්‍රාදේශීය කාර්යාල කඩිනමින් විවෘත කිරීමේ මූලික පියවරක් ලෙස 2013,2014 සහ 2015 වර්ෂ වලදි දෙපාර්තමේන්තුවට අනුයුක්තව සංවර්ධන නිලධාරී පත්වීම් ලබු 06 ක්එම ප්‍රදේශ වල ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට තාවකාලිකව අනුයුක්ත කරඇතත් එම කාර්යාල පිහිටුවීම හෝ ඒ සඳහා ගත යුතු මූලික පියවරයන් නොගෙන සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දක්වා කාලය තුළ එම නිලධාරීන් 5 දෙනෙකු වෙත වැටුප් දීමනා සහිතව රු.2,827,836 ක මුදලක් ගෙවා තිබුණි.එක් නිලධාරිනියකගේ වැටුප් හා දීමනා විස්තර විගණනයට ඉදිරිපත් නොවූ අතර එම නිලධාරීන්ගේ රාජකාරී හා පරිපාලන කටයුතු වලට දෙපාර්තමේන්තුව සම්බන්ධ නොවන අතර, වැටුප් හා දීමනා ගෙවීම පමණක් සිදු කර තිබුණි.

(ආ) 2022 පෙබරවාරි 07 දින පත්වීම් ලබා දෙන ලදනිලධාරීන් 08 දෙනෙකු වවුනියාව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත සංවර්ධන නිලධාරී තනතුර සඳහා අනියුක්ත කර දෙපාර්තමේන්තු රාජකාරී ඉටු කරගැනීමකින් තොරව මාස 11 ක කාලයකට රු.4,467,690 ක මුදලක් වැටුප් වශයෙන් ගෙවා තිබුණි.

(ඇ) මැනුම් ඉල්ලීම් යැවීමේ සිට බිම් සවිය වැඩසටහනේ ක්‍රියාකාරකම්වල භෞතික ප්‍රගතිය ශූන්‍ය අගයක් ගෙන තිබුණද, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ කාර්යාලය පවත්වාගෙන යාම වෙනුවෙන් කාර්යාල කුලී ලෙස රු. 1,116,000 ක මුදලක් සමාලෝචිත වර්ෂයේ ජනවාරි සිට දෙසැම්බර් දක්වා ගෙවා තිබුණි.

4 තිරසාර සංවර්ධනය

දෙපාර්තමේන්තුව විසින්තිරසර සංවර්ධන අරමුණු හඳුනා ගෙන තිබුණද, අදාළ අරමුණු එක්සත් ජාතීන්ගේ සංවිධානය මඟින් ස්ථාපිත කරනු ලැබූ තිරසර සංවර්ධන අරමුණු සමඟ සම්බන්ධ වන ආකාරය සහ 2030 වර්ෂය දක්වා කාලය තුළ ඉටුකර ගැනීමට අපේක්ෂිත ඉලක්ක නිශ්චිතව හඳුනා ගෙන 2022 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම මඟින් වාර්ෂිකව ඉටුකර ගැනීමට අපේක්ෂිත ඉලක්ක හා ප්‍රගතිය පිළිබඳ සඳහන් කර නොතිබුණි. ඒ අනුව තිරසර සංවර්ධන අරමුණු ඉටු කිරීම සඳහා දෙපාර්තමේන්තුවේ දායකත්වය නිශ්චිතව ඉදිරිපත් කර නොතිබුණි.

5. මානව සම්පත් කළමනාකරණය

5.1 අනුයුක්තකාර්ය මණ්ඩලය, නථ්‍ය කාර්ය මණ්ඩලය

දෙපාර්තමේන්තුවේ අනුමත හා නත්‍ය කාර්ය මණ්ඩලය පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

විස්තරය	අනුමත සංඛ්‍යාව	තත්‍ය සංඛ්‍යාව	පුරප්පාඩු සංඛ්‍යාව
ජ්‍යෙෂ්ඨ මට්ටම	105	34	71
තෘතීක මට්ටම	07	05	02
ද්විතීක මට්ටම	1746	810	936
ප්‍රාථමික මට්ටම (ස්ථීර/කොන්ත්‍රාත්)	254	142	112
එකතුව	**2112**	**991**	**1121**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) දෙපාර්තමේන්තුව තුල ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 71 ක්,ද්විතියක හා තෘතීක මට්ටමේ පුරප්පාඩු 938 ක් ඇතුළුව මුළු පුරප්පාඩු 1121 ක් පැවතුණි.

(ආ) අනුමත වී තිබූ කොමසාරිස් තනතුරු 01 ක්, දිස්ත්‍රික් කොමසාරිස් තනතුරු 03 ක් නියෝජ්‍ය / සහකාර කොමසාරිස්වරු 65 ක් ගණකාධිකාරී හා නීති නිලධාරී යන ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 71 ක් පුරප්පාඩු පැවතීම හේතුවෙන් සැලසුම්ගත ඉලක්ක හා අරමුණු ළඟාකර ගැනීමට බාධාවන් දෙපාර්තමේන්තුව විසින් හඳුනාගෙන තිබුණද, අදාළ පුරප්පාඩු පිරවීමට හෝ සේවා අවශ්‍යතාවය මත අනුමත තොරතුරු සංශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) ජ්‍යෙෂ්ඨ මට්ටමේ නියෝජ්‍ය / සහකාර කොමසාරිස් තනතුරු 04 ක් සඳහා නිලධාරීන් පත් නොකර කොන්ත්‍රාත් පදනම මත පත්කර තිබුණි.

(ඈ) ද්විතීක හා තෘතීක මට්ටමේ තනතුරු 09 ක පවතින 1048 ක පුරප්පාඩු පිරවීමට හෝ සේවා අවශ්‍යතාවය සලකා බලා අනුමත කාර්යය මණ්ඩලය සංශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) බිම් සවිය වැඩසටහන දේශීය අරමුදල් ව්‍යාපෘතියක් ලෙස ක්‍රියාත්මක කිරීම මැයෙන් ඉඩම් අමාත්‍යතුමා ඉදිරිපත් කල 2017 සැප්තම්බර් 28 දිනැති සංදේශ අංක LD/CM/14/2007 මඟින් බඳවා ගැනීම ප්‍රමාදවන අවස්ථා වලදී හා ඉතා හදිසි අවස්ථාවලදී නිලධාරීන් කොන්ත්‍රාත් පදනමින් වැඩ සටහන සඳහා බඳවා ගැනීම සඳහා කල යෝජනාවට 2017 ඔක්තෝබර් 17 දිනැති අංක අමප/07/1758/336/007 මඟින් අනුමැතිය ලබා දී තිබුණද, ඉකුත් වර්ෂ වලදී ඒ අනුව කටයුතු කර කාර්ය සාධනය ඉහළ නංවා ගැනීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.

ඊ.කේ.එම්.පී. නෝනිස
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
ජාතික විගණන කාර්යාලය

පී.කේ.එම්.පී.නෝනිස්
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට